
# කාර්ය සාධනය
# செயலாற்றுகை
# PERFORMENCE 2012



පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය
உள்ளூராட்சி மற்றும் மாகாண சபைகள் அமைச்சு
**MINISTRY OF LOCAL GOVERNMENT & PROVINCIAL COUNCILS**

**පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය**

330, යුනියන් පෙදෙස, කොළඹ 02




# කාර්ය සාධන වාර්තාව
# 2012

# පටුන


| | |
|---|---|
| ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය | 5 |
| ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | 7 |
| අමාත්‍යාංශ ලේකම්ගේ පණිවුඩය | 9 |
| 1. අමාත්‍යාංශයේ දැක්ම | 11 |
| 2. අමාත්‍යාංශයේ මෙහෙවර | 12 |
| 3. අමාත්‍යාංශයේ අරමුණු | 13 |
| 4. අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර | 14 |
| 5. මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර | 15 |
| 6. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල | 16 |
| 7. අමාත්‍යාංශයේ මූලික කාර්යභාරය | 17 |
| 8. පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍ර තුළ අත්කර ගත් ජයග්‍රහණ | 19 |
| 9. කාර්ය සාධනය - 2012 | 20 |
| 10. ප්‍රධාන පළාත් පාලන සහ පළාත් සභා සංවර්ධන ව්‍යාපෘති | 42 |
| 11. ව්‍යාපෘති මාලාව | 45 |
| 12. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) | 57 |
| 13. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) | 60 |



# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

දේශීය ආර්ථිකය නංවාලීම තුළින් ගම දියුණුකර රටේ සංවර්ධනය ළඟාකර ගැනීමේදී අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය තුළින් සංවර්ධනයෙහි විප්ලවීය වෙනසක් සිදුවෙමින් පවතින මෙම කාලය තුළදී පළාත් පාලන ක්ෂේත්‍රයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින් පළාත් පාලන ආයතන (ඡන්ද විමසීම්) පනත් කෙටුම්පත හා පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2012.10.10 දින පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මත වීම පොදුවේ රටත් වර්තමාන රජය හා විශේෂයෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයත් ලද විශේෂ ජයග්‍රහණයක් බව සඳහන් කරනු කැමැත්තෙමි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "මහින්ද චින්තන" සංවර්ධන වැඩපිළිවල යටතේ ආරම්භ කර ඇති සංවර්ධන ක්‍රියාදාමය වඩාත් අර්ථවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලනය තුළ 'යහ පාලනය' සවිමත් කිරීමට මාගේ අමාත්‍යාංශය විසින් විශේෂ වැඩසටහන් රාශියක් දැනටමත් දියත් කර ඇති බව ද සතුටින් සඳහන් කරමි. ඒ අනුව තෝරාගත් පසුගාමී පළාත් පාලන ආයතන වෙත විශේෂ අවධානය යොමුකරමින් පළාත් පාලන බල ප්‍රදේශවල ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා මෙන්ම යටිතල පහසුකම් නගා සිටුවීමට පියවර ගනිමින් සිටී. දැනට දිවයිනේ ඇති පළාත් පාලන ආයතන රැසකට අභියෝගයක්ව පවතින අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවල විධිමත්ව හා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා උපකාර ලෙස අප අමාත්‍යාංශය විසින් ද විවිධ පියවර ගෙන ඇත. එමෙන්ම, දශක තුනක කුරිරු යුද්ධයෙන් දැඩි ලෙස පීඩාවට පත්වූ උතුරේ හා නැගෙනහිර පළාත් පාලන ආයතන ප්‍රතිෂ්ඨාපිත කිරීම සඳහා ද පියවර ගෙන ඇත. එලෙසම පළාත් සභා කාර්යක්ෂමව හා බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය පියවර ද අමාත්‍යාංශය විසින් ගෙන ඇත.

තවද සියලුම පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ස්වාභාවික සම්පත් හා පරිසරය නිසි ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය මාර්ගෝපදේශ හා උපදෙස් නිකුත් කිරීමට ද අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇත. ඒ තුළින් නිසි ආදායම් ජනනයවීම අපේක්ෂා කෙරේ.

අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී මඟ පෙන්වීම සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය ඉන්දික බණ්ඩාරනායක මැතිතුමාගේ ද අමාත්‍යාංශයේ ලේකම් ආර්.ඒ.ඒ.කේ. රණවක මහතාගේ ද,

අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගෙන් ලද නොමසුරු සහයෝගය ද මම බෙහෙවින් අගය කොට සළකන අතර, 2012 වසරේ මෙන්ම පසුගිය වසර කිහිපය තුළ පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ ජයග්‍රහණ වෙනුවෙන් දැක්වූ දායකත්ව සඳහා සියලුම පළාත් ආණ්ඩුකාරතුමන්ලා, පළාත් ගරු ප්‍රධාන ඇමතිතුමන්ලා ඇතුළු ගරු පළාත් අමාත්‍යවරු, ගරු පළාත් සභා මන්ත්‍රීවරු ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත්, ගරු නගරාධිපතිතුමන්ලා හා නගර සභා ගරු සභාපතිතුමන්ලා, ප්‍රදේශීය සභා ගරු සභාපතිතුමන්ලා ඇතුළු පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට හා එහි කාර්ය මණ්ඩලවලටත් මගේ කෘතඥතාවය පුදකරනු කැමැත්තෙමි.

ඒ.එල්.එම්. අතාඋල්ලා, පා.ම.
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය



# ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මේ රටේ පළාත් පාලන ආයතන මට්ටමෙන් මෙන්ම ප්‍රාදේශීය මට්ටමෙන් මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබාදීම හා මහජනතාව සංවර්ධනයේ සමීප හවුල්කරුවන් බවට පත් කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කරන නියමුවෙකු වශයෙන් ක්‍රියා කරයි. මෙහිදී මෑත ඉතිහාසයේ ලත් කැපී පෙනෙන ජයග්‍රහණය වන්නේ පළාත් පාලන මැතිවරණ සංශෝධනයයි. තවද පළාත් මට්ටමේ සංවර්ධන අසමතුලිතතාවය අවම කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ක්‍රියාවට නංවා ඇති විවිධ සංවර්ධන ව්‍යාපෘති මඟින් රටේ සමස්ථ සංවර්ධනයට කෙරෙන දායකත්වය ඉතා විශිෂ්ඨ බව මම විශ්වාස කරමි. එවැනි එක් වැඩසටහනක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණයේ නගර සංවර්ධනය ඉලක්ක කර ගත් 'පුර නැගුම' සංවර්ධන වැඩසටහන මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

එමෙන්ම පළාත් පාලන ආයතනවලින් සපයනු ලබන මහජන සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මට්ටමෙන් ලබාදීමට පළාත් පාලන ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන හඳුන්වා දී ඇත. මේ සියළු වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් ඉතා හොඳ සම්බන්ධීකරණයක් ඇති කිරීම හා ඒ සඳහා දැනටමත් මගේ අමාත්‍යාංශය මඟින් ගෙන ඇති ක්‍රියා මාර්ග මම බෙහෙවින් අගය කරමි.

ගරු පළාත් පාලන හා පළාත් සභා ඇමතිතුමාට, අමාත්‍යාංශ ලේකම්වරයාට මෙන්ම මෙම සංවර්ධන වාර්තාවේ සටහන් වන අප අමාත්‍යාංශයේ කාර්ය සාධනයෙහිලා දායක වූ සියළු නිලධාරීන්ට ද මාගේ අවංක ස්තුතිය පල කරමි.

ඉන්දික බණ්ඩාරනායක, පා.ම.
පළාත් පාලන සහ පළාත් සභා නියෝජ්‍ය අමාත්‍ය



# ලේකම්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ අරමුණ කරා ලඟාවීමේදී පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රය තුළ කළ යුතු හා ඉටුකළ හැකි සංවර්ධන ක්‍රියාදාමය අතිමහත්ය. 2012 වසර තුළ අමාත්‍යාංශයට එහි විෂය පථය යටතට ගැනෙන කාර්යභාරය තුළ විවිධ නීතිමය ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන ප්‍රවේශයන් ඉටුකර ගැනීමට හැකියාව ලැබුණි. තවද පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් ඇතුළු පහසුකම් සැපයීමත්, ඒවායේ කළමනාකරණ හැකියාවන් දියුණු කරලීමට ගනු ලැබූ පියවරයන් තුළින් ජනතාවට සැපයෙන සේවාවන්වල ගුණාත්මක වර්ධනයක් ඇති කරලීම සඳහා ප්‍රවේශ වීමටත් හැකියාව ලැබුණි.

දැකුම්කළු, ප්‍රියමනාප සහ පිරිසිදු කුඩා නගර ලෙස, තෝරාගත් නගර සංවර්ධනය සඳහා වූ 'පුර නැගුම' වැඩසටහන මේ වසරේදී ආරම්භ වූ අතර, එහි ක්‍රියාත්මක වැඩසටහන් 2013 වසර තුළදී සිදු කිරීමට නියමිතය. ඒ යටතේ කුඩා නගරවල පහසු ප්‍රවේශ මාර්ග, සතිපොළවල්, පුස්තකාල, ළමා උද්‍යාන, වැසිකිළි, රථ ගාල්, ගිමන්හල් ආදී යටිතල පහසුකම් නංවාලීම ආරම්භ කෙරේ. එසේම කසළ කළමනාකරණ වැඩසටහන්, කොළඹ නගරය තුළ ශතවර්ෂයක් පමණ පැරණි මළ අපද්‍රව්‍ය හා අප ජලය බැහැර කිරීම, අන්තර් නගර මාර්ග සංවර්ධනය, ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කළ තවත් වැඩසටහන් කිහිපයකි. තවද පළාත් පාලන ආයතනවල සේවා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම පිණිස කාර්යාල පරිශ්‍රය මහජන මිත්‍රශීලී පරිසරයක් බවට පත් කිරීමත්, පරිගණක ජාල පද්ධතිය මගින් සේවා සැපයීම නවීකරණය කරමින් වඩා හොඳ සේවා මධ්‍යස්ථාන බවට පත් කිරීමත් ඉදිරි පියවරයන් අතර වේ.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය සමග 2012 අයවැය ප්‍රකාශනයේ අඩංගු යෝජනා ද මගින් වැඩසටහන් නිර්මාණය කොට ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති මග පෙන්වීමත්, ගරු ඇමතිතුමාගේ හා නියෝජ්‍ය ඇමතිතුමාගේ මෙහෙයවීමත්, කාර්යය මණ්ඩලයේ හා පළාත් පාලන ආයතන හා පළාත් සභා ක්‍රියාකාරී ආයතනයන් මේ මොහොතේ ගෞරවයෙන් යුක්තව සිහිපත් කරමි.

ආර්.ඒ.ඒ.කේ. රණවක
ලේකම්

# 1

## අමාත්‍යාංශයේ දැක්ම

බලය බෙදාහැරීම, විමධ්‍යගතකරණය සහ සහභාගීත්ව පාලන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමෙහි ලා කටයුතු කරන ප්‍රමුඛ හා ප්‍රශස්ථ ආයතනය බවට පත් වීම.

# 2

## අමාත්‍යාංශයේ මෙහෙවර

ජනතා අභිලාශයන් සඵල කරවන අන්දමේ කාර්යක්ෂම හා ඵලදායී පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමයක් තහවුරු කිරීම සහ විමධ්‍යගත පාලන ව්‍යුහය සවිමත් කිරීමත් දිරිගැන්වීමත් මඟින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර මානව සංවර්ධනයක් උදාකර ගැනීම සඳහා පහසුකම් සම්පාදනය.

# 3

## අමාත්‍යාංශයේ අරමුණු

- මධ්‍යම රජය සහ පළාත් සභා අතර සම්බන්ධීකරණය
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය
- ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට සහාය වීම
- මූල්‍ය, තාක්ෂණික හා නෛතික සහාය ලබාදීම සහ ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම
- අන්තර්ජාතික සබඳතා පවත්වාගෙන යාම සහ විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පළාත් පාලන මැතිවරණ පිළිබඳව ජාතික මට්ටමේ වගකීම
- ඵලදායී විමධ්‍යගත පාලනයක් නියාමනය කිරීම
- භෞතික, ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වර්ධනයට සහාය වීම

# 4

# අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර

**1. පළාත් පාලනයට අදාළ ජාතික නීති වර්තමානයට ගැළපෙන අයුරින් සකස් කිරීම.**

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා පළාත් පාලන (විශේෂ විධිවිධාන) සංශෝධනය කිරීම
- මහනගර සභා ආඥා පනත සංශෝධනය කිරීම
- නගර සභා ආඥා පනත සංශෝධනය කිරීම
- ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම
- පළාත් පාලන පරිපාලනය, පිරිස් පාලනය, ආදායම් වලට අදාළ නීති සංශෝධනය
- මහජන සෞඛ්‍යයට හා පරිසරයට අදාළ නීති
- පොදු උපයෝගිතා සේවා

**2. පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රශස්ත පාලනයක් සඳහා අවශ්‍ය සහය ලබා දීම**

- දැනුවත් කිරීම හා පුහුණු කිරීම
- කාර්යය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම
- නීති කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව ප්‍රවර්ධනය
- පළාත් පාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම

**3. පළාත් පාලන ආයතන වල සේවා සැපයීම කාර්යක්ෂම කිරීම**

- ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
- පරිගණක ආශ්‍රිත සේවා සැපයීමේ යාන්ත්‍රනයක් නිර්මාණය කිරීම

**4. සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම**

- ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා විදේශ ආයෝජන යෙදවීම
- ප්‍රාදේශීය මාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය, සනීපාරක්ෂාව, කසළ, ආපදා කළමනාකරණය වැනි ක්ෂේත්‍ර ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

# 5

# මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර

- ගම්මානවල ජන ඝනත්වය පදනම් කරගෙන සුදුසු ප්‍රදේශවල ග්‍රාමීය ජලසම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම (පි.අ. 67)
- රෝහල් සඳහා කේන්ද්‍රයික අපජල බැහැර කිරීමේ පද්ධති ලබා දීම (පි.අ. 67)
- ප්‍රාදේශීය කේන්ද්‍රස්ථාන හඳුනා ගැනීම සඳහා නව මාවත් ගොඩනැගීම (පි.අ. 97)
- පුළුල් කලයුතු මාර්ග හඳුනා ගැනීම සහ වැඩි දියුණු කිරීම (පි.අ. 97)
- මාර්ග නඩත්තු කිරීමේ කළමනාකරණ පද්ධතියක් යොදා ගැනීම (පි.අ. 97)
- අත්‍යාවශ්‍ය මංසන්ධි හඳුනාගෙන රථවාහන කළමනාකරණ ක්‍රම සහ පදික පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කෙරෙනු ඇත (පි.අ. 98)
- ත්‍රීරෝද රථ ගාල් සැපයීම (පි.අ. 106)
- නව පදික මාවත් හා බයිසිකල් සඳහා මාවත් ඉදිකිරීම (පි.අ. 108)
- නගර සභා හා මහ නගර සභාවල අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සහ ජල සම්පාදනය (පි.අ. 163)
- පොදු ස්ථාන හා සේවාවන් වෙත පහසු ප්‍රවේශය සඳහා පහසුකම් වැඩිකිරීම හා නියාමය කිරීම (පි.අ. 194)
- විනෝද උද්‍යාන හා ඇවිදීමේ පථයන් පිහිටුවීම (පි.අ. 194)
- පළාත් සභාවල සහ ප්‍රාදේශීය සභාවල කාන්තා නියෝජනය ඉහළ නැංවීම (පි.අ. 194)

*** ඉහත දක්වා ඇත්තේ මහින්ද චින්තන ඉදිරි දැක්ම පිටු අංකයන් වේ.**

# 6

# පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල

පළාත් පාලන හා පළාත් සභා ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලතාව දැක්වීම වඩාත් පහසුකරලීම සඳහා අමාත්‍යාංශයේ විවිධ අංශ, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති ස්වකීය පුළුල් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- පළාත් පාලන හා පළාත් සභා ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
- පළාත් පාලන හා පළාත් සභා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
- පාලන අංශය
- මුදල් අංශය
- පළාත් පාලන අංශය
- පළාත් සභා සහ පුහුණු අංශය
- නීති අංශය
- සංවර්ධන හා සැලසුම් අංශය
- ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
- වියදම් විමංසන අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ප්‍රතිපත්ති හා තොරතුරු අංශය
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල

පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ ජාතික පුහුණු ආයතනය වන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එසේම දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කළමනාකරණ කටයුතු ද මෙම අමාත්‍යාංශය මඟින් ඉටුකරන සුවිශේෂී කාර්යයකි.

# 7

# අමාත්‍යාංශයේ මූලික කාර්යභාරය

රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය, පළාත් පාලන හා පළාත් සභා ආයතන තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීම, විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය.

## 1. ප්‍රධාන පළාත් සභා ක්‍රියාකාරකම්

- පළාත් සභා 9 සහ පළාත් පාලන ආයතන 335 වෙත සහාය සේවා සම්පාදනය.
- පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආධාර ව්‍යාපෘති සඳහා විධායක ආයතනය වශයෙන් කටයුතු කිරීම
- දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට මඟ පෙන්වීම හා සහාය ලබාදීම.
- ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය තුළින් පළාත් පාලන ආයතනවලට අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම.
- පළාත් සභාවලට ප්‍රතිපාදන නිදහස් කිරීම හා වියදම් විමංසනය.
- විදේශ ණය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
- නැගෙනහිර හා උතුරු පළාත්වල පාලන කටයුතු ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

## 2. ප්‍රධාන පළාත් පාලන ක්‍රියාකාරකම්

- යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය කිරීමට හා යහපාලනය ප්‍රවර්ධනය කිරීමට පළාත් පාලන ආයතනවලට සහාය දැක්වීම.
- පසුගාමී පළාත් පාලන ආයතනවලට විශේෂ සංවර්ධන සහායන් ලබාදීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල විධිමත්ව ශක්තිමත්ව කිරීමට සහාය දැක්වීම.
- පළාත් පාලන ව්‍යවස්ථා සංශෝධනය කිරීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.

- පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම හා නව පළාත් පාලන ආයතන ස්ථාපනය කිරීම.
- ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම, ආපදා කළමනාකරණය සඳහා පෙර සූදානම සහ ආයතනික හැකියා ප්‍රවර්ධනය.
- උතුරු හා නැගෙනහිර පළාත්වල පළාත් පාලන පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහාය වීම.
- 'පුර නැගුම' වැඩසටහන ආරම්භ කිරීම සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස අවසන් කිරීම.
- කසළ කළමනාකරණය / මලාපවහන පද්ධතිය නවීකරණය.
- යන්ත්‍ර සූත්‍ර / ගලිබවුසර්, ජල බවුසර් වැනි පහසුකම් සැලසීම.

# 8

# පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුළ අත්කර ගත් ජයග්‍රහණ

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත සම්මත කර ගැනීම.
- මහනගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය.
- අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවලට සහාය පිණිස අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධනය සඳහා 'පුර නැගුම' ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- පළාත් පාලන ආයතනය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන් හඳුන්වා දීම.
- සේවා සැපයීම පහසු කිරීම/ පරිගණක අන්තර්ජාල පහසුකම් සැපයීම.
- පළාත් පාලන ආයතන සතු කේන්ද්‍රීය ග්‍රාමීය මාර්ග හඳුනා ගැනීම සහ මාර්ග ලේඛනය පිළියෙල කිරීම මඟින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමට ආයෝජන සැලැස්මක් සකස් කිරීම.
- නැගෙනහිර, උතුරුමැද, සබරගමුව, මධ්‍යම, ඌව හා උතුරු පළාත්වල පළාත් මාර්ග කි.මී. 1115 ක් සංවර්ධනය කිරීම සඳහා විදේශ ණය ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කිරීම.
- සියලුම පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණය ඉතාමත්ම ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කිරීම.
- පළාත් දෙපාර්තමේන්තු උත්ශ්‍රේණිගත කිරීම.
- පළාත් සභා ධූරධාරී වරප්‍රසාද සමරූපී කිරීම.
- පළාත් සභාවල නීති අංශ ශක්තිමත් කිරීම.
- දීප ව්‍යාප්ත ගිනි ආරක්ෂණ සැලැස්මක් ඇති කිරීම.
- පළාත් සංවර්ධනය සඳහා විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පළාත් පාලන ආයතනවල සභිකයන් සහ නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පළාත් පාලන ආයතන අතර කළමනාකරණ තරඟය හා පළාත් පාලනය පිළිබඳ මහා සමුළුව පැවැත්වීම මඟින් පළාත් පාලන සේවාවල ඵලදායිතාවය ඉහළ දැමීම.
- 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය හා සංවර්ධන වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 18 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය හා සංවර්ධන වැඩසටහනේ 6 වන ස්ථානය ලැබීම.

# 9

# කාර්ය සාධනය - 2012

## 9.1 පළාත් පාලන අංශය

### 9.1.1 අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ වැඩසටහන

අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන 16 ක් තෝරාගෙන විධිමත් පරිදි මහජන සේවා සැළසීමට හැකි වන අයුරින් එම ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම්, කාර්යාල උපකරණ හා පෙර පාසල් පොත් හා උපකරණ මිල දී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත. 2012 වසර සඳහා රුපියල් මිලියන 36.4 ක මුදලක් වෙන් කර තිබූ අතර එයින් 2012.12.31 දිනට රු.මි. 22.91 ක් වැය කරමින් අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

**2012.12.31. දිනට මූල්‍ය (මූල්‍ය ප්‍රගතිය 63% කි) හා භෞතික ප්‍රගතිය**

| **පළාත් පාලන ආයතනය** | **ව්‍යාපෘතිය** | **යෙදවූ මුදල (රු.මි)** |
|---|---|---|
| 1. මැදිරිගිරිය ප්‍රා.ස. | ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදිකිරීම | 1.77 |
| 2. ඇලහැර ප්‍රා.ස. | ප්‍රා.ස.ගො. කාර්යාල උපකරණ මිලදී ගැනීම | 1.86 |
| 3. මීගහකිවුල ප්‍රා.ස. | ප්‍රා.ස.ගො. ඉදිකිරීම හා සිවිලිම සැකසීම | 0.74 |
| 4. රිදීමාලියද්ද ප්‍රා.ස. | ප්‍රා.ස.ගො. ඉදිකිරීම - අවසන් ගෙවීම | 0.14 |
| 5. රිදීගම ප්‍රා.ස. | පෙරපාසල් පොත් හා උපකරණ මිලදී ගැනීම | 0.80 |
| 06. බිංගිරිය ප්‍රා.ස. | පෙරපාසල් පොත් හා උපකරණ මිලදී ගැනීම | 0.50 |
| 07. කුලියාපිටිය ප්‍රා.ස. | පෙරපාසල් පොත් හා උපකරණ මිලදී ගැනීම | 1.00 |
| 08. වනාතවිල්ලුව ප්‍රා.ස. | මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | 0.10 |
| 09. වැලිගෙපොල ප්‍රා.ස. | කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 1.45 |
| 10. අක්කරෙයිපත්තු ම.න.ස. | ජෙනරේටර් මිළට ගැනීම | 2.23 |
| 11. අක්කරෙයිපත්තු ප්‍රා.ස. | ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදිකිරීම | 4.10 |
| 12. මහඔය ප්‍රා.ස. | කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 2.00 |
| 13. පොතුවිල් ප්‍රා.ස. | සංස්කෘතික මධ්‍යස්ථානය-පළමු අදියර ගෙවීම | 0.71 |
| | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 0.99 |
| 14. ඉරක්කාමම් ප්‍රා.ස | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 3.99 |
| 15. වැලිවිටිය දිවිතුර ප්‍රා.ස. | ප්‍රා.ස.ගො. ඉදිකිරීම-රැදවුම් මුදල් ගෙවීම | 0.41 |
| 16. ලුනුගල ප්‍රා.ස. | ප්‍රා.ස.ගො. ඉදිකිරීම-රැදවුම් මුදල් ගෙවීම | 0.12 |
| **යෙදවූ මුදල** | | **22.91** |

### 9.1.2. පළාත් පාලන ආයතන සතු වාහන අලුත්වැඩියා කිරීම

පළාත් පාලන ආයතන 20 ක වසර 10 කට වඩා පැරණි ඉතාමත් අබලන් තත්වයේ පැවැති ඩබල් කැබ් රථ 20 ක් අලුත්වැඩියා කිරීමට මෙම වසරේ කටයුතු කර ඇත. මේ සඳහා වෙන්කල මුදල රුපියල් මිලියන 18.2 ක් වන අතර, සත්‍ය වියදම රුපියල් මිලියන 16.5 කි.

**2012.12.31. දිනට මූල්‍ය (මූල්‍ය ප්‍රගතිය 91% කි) හා භෞතික ප්‍රගතිය**

| පළාත් පාලන ආයතනය | යෙදවූ මුදල (රු.මිලියන) |
|---|---|
| 1. උඩුදුම්බර ප්‍රාදේශීය සභාව | 1.38 |
| 2. පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | 1.04 |
| 3. නෙළුව ප්‍රාදේශීය සභාව | 0.21 |
| 4. රජ්ගම ප්‍රාදේශීය සභාව | 0.50 |
| 5. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | 1.90 |
| 6. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව | 0.66 |
| 7. යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව | 1.25 |
| 8. ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව | 0.63 |
| 9. නවගත්තේගම ප්‍රාදේශීය සභාව | 1.35 |
| 10. කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව | 0.18 |
| 11. නාරම්මල ප්‍රාදේශීය සභාව | 1.44 |
| 12. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව | 0.37 |
| 13. ආණමඩුව ප්‍රාදේශීය සභාව | 0.26 |
| 14. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව | 0.76 |
| 15. විල්ගමුව ප්‍රාදේශීය සභාව | 0.92 |
| 16. වලල්ලාවිට ප්‍රාදේශීය සභාව | 1.00 |
| 17. ගිරිබාව ප්‍රාදේශීය සභාව | 0.87 |
| 18. පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව | 1.00 |
| 19. උඩුබද්දාව ප්‍රාදේශීය සභාව | 0.64 |
| 20. තවලම ප්‍රාදේශීය සභාව | 0.14 |
| **යෙදවූ මුදල** | **16.50** |

### 9.1.3. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම

2012 අංක 22 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත සහ 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යන පනත් සම්මත කිරීම හේතුවෙන් පළාත් පාලන බල ප්‍රදේශවල සීමා නිර්ණය කිරීමට පත් කල ජාතික සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව ලද පසු පහත සඳහන් ආයතන සංස්ථාපනයට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

1. පාදුක්ක ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
2. දෙල්තොට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
3. දොළුව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
4. ගෝනාපීනුවල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
5. ඕකේවල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
6. වලස්මුල්ල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
7. බමුණාකොටුව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
8. මහවැව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
9. කිරිඇල්ල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
10. සෙවනගල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
11. කාරච්චි උතුර ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
12. මහකුඹුක්කඩවල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
13. හොරණ නගර සභාවේ සීමා පුළුල් කිරීම.
14. හතරලියද්ද ප්‍රාදේශීය සභාව ස්ථාපනය.
15. අම්බලංගොඩ නගර සභාවේ සීමා පුළුල් කිරීම.
16. වැලිපිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
17. මල්ලවපිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
18. පල්ලම ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
19. මොණරාගල නගර සභාව සංස්ථාපනය.
20. විලච්චිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
21. අම්පාර මහ නගර සභාව සංස්ථාපනය.
22. ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.
23. පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය සභා සංස්ථාපනය.

ඉහත සඳහන් පනත් දෙක සම්මත වීමට ප්‍රථම මිල්ලනිය ප්‍රාදේශීය සභාව 2012.10.02 දින අළුතින් සංස්ථාපනය කිරීමට කටයුතු කර ඇත.

### 9.1.4. පළාත් පාලන ආයතන සඳහා කාර්ය මණ්ඩල ලබාදීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව හා මෙම අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන ඇතුළු සියලුම පළාත් සභාවලට අත්‍යාවශ්‍ය කාර්යමණ්ඩල පිළිබඳ සවිස්තරාත්මක තක්සේරුවක් මෙම වසරේදී සිදු කරන ලදී.

ඒ අනුව පළාත් පාලන ආයතනවල කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙනයාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා නිර්දේශ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අදාළ අනුමැතියන් ලබා ගෙන අමාත්‍යාංශය විසින් එම සභා වෙත මේ වන විට දන්වා යවා ඇත.

### 9.1.5 පළාත් පාලන සතිය

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය තුළ, එම ආයතන විසින් ඉටුකරනු ලබන මහජන උපයෝගීතා සේවා ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීම, එම ආයතනයන්හි මානව හා භෞතික සම්පත් උපයෝගී කරගැනීම තුළින් පළාත් පාලන ආයතන මගින් මහජනතාව වෙත උපරිම කාර්යක්ෂමතාවයකින් සේවා සැපයීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම සහ පළාත් පාලන ආයතන පිළිබඳව හා මහජන සේවාවන් පිළිබඳව ජනතාව අතර යහපත් ආකල්ප සහ සම්බන්ධතාවයන් ගොඩනැගීම පළාත් පාලන සතිය පැවැත්වීමේ මූලික අරමුණ වේ. මේ අනුව මෙම වසරේ පළාත් පාලන සතිය වැඩසටහන පැවැත්වූ අතර, එහි සම්මාන ප්‍රධානෝත්සවය 2013 ජනවාරි මස පැවැත්වීමට නියමිතය.

වාර්ෂිකව පැවැත්වෙන පළාත් පාලන සතිය තුළ දී ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන් මෙසේය.

| පැවැත් වූ දිනය | ක්‍රියාත්මක කල වැඩසටහන් |
|---|---|
| 2012.10.15 | සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය |
| 2012.10.16 | අධ්‍යාපන හා පුස්තකාල සංවර්ධන දිනය |
| 2012.10.17 | ජංගම සේවා දිනය |
| 2012.10.18 | මහජන උපයෝගිතා දිනය |
| 2012.10.19 | පරිසර හා රුක්රෝපන දිනය |
| 2012.10.20 | ආදායම් ප්‍රවර්ධන දිනය |
| 2012.10.21 | ක්‍රීඩා දිනය හා ත්‍යාග සහ සහතික ප්‍රදානය |

### 9.1.6 පළාත් පාලන කළමනාකරණ තරගය සහ පළාත් පාලන ජාතික සමුළුව පැවැත්වීම

මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පළාත් පාලන ආයතනයන්හි යහපාලනය හා කළමනාකරණ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස ජාතික මට්ටමෙන් පළාත් පාලන කළමනාකරණ තරගය පවත්වා අදාළ ජයග්‍රාහී ආයතනවලට ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීම සහ එම ජයග්‍රාහී ආයතන ජාතික මට්ටමින් ඇගයීම පිණිස සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් වාර්ෂික පළාත් පාලන සමුළුව, පළාත් පාලන සතිය වැඩ සටහනට සමගාමීව පවත්වනු ලැබේ. සියලු කටයුතු අවසන් වූ පසු එහි සම්මාන ප්‍රධානෝත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වාර්ෂිකව පවත්වනු ලැබේ. මෙම වසරේ එම සම්මාන ප්‍රධානෝත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2013 ජනවාරි මස පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර ඇත.

### 9.1.7 පළාත් පාලන ආයතන දත්ත පද්ධතියක් සකස් කිරීම.

සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්, නියෝජ්‍ය ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරීන්ගේ නම් සහ දුරකතන අංක ඇතුළත් පළාත් පාලන ආයතන තොරතුරු සංග්‍රහයක් සකස් කරමින් පවතී. එය මුද්‍රණය කළ පසු සියලුම රාජ්‍ය ආයතන සහ පළාත් සහ පළාත් පාලන ආයතන වෙත ලබා දීමට නියමිතව ඇත.

### 9.1.8 පොදුරාජ්‍ය මණ්ඩල පළාත් පාලන සම්මේලනය පැවැත්වීම

පොදු රාජ්‍ය මණ්ඩල පළාත් පාලන ආයතනයන්ගේ ආසියා කලාපීය සමුළුව ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාවට අතිශයින්ම වැදගත් වූ සමුළුවකි. සමුළු නියෝජිතයින් එය මෙරට පැවැත්වීමට තීරණය කර තිබූ අතර, එමගින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ඉහළ නැංවීමට හැකිවිය.

මෙම සමුළුව පළමු වරට 2012 අප්‍රියෙල් මස 24 සහ 25 දෙදින තුළ කොළඹදී සාර්ථකව පවත්වන ලදි.

මේ සඳහා ඉන්දියාව, බංග්ලාදේශය, මැලේසියාව, මාලදිවයින, පකිස්ථානය, තායිලන්තය, ශ්‍රී ලංකාව හා එක්සත් රාජධානිය යන රටවල් සහභාගී වූ අතර, එහිදී පළාත් පාලනයට අදාළ අත්දැකීම් හුවමාරු කර ගන්නා ලදි.

## 9.2 පළාත් සභා හා පුහුණු අංශය

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, පළාත් සභාව සහ මධ්‍යම රජය අතර සම්බන්ධීකරණය හා මානව සම්පත් සංවර්ධනය යනාදී කටයුතු මෙම අංශය මගින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි. මෙම වසරේදී සියලුම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ගේ රැස්වීම් වාර දෙකක් පවත්වා ප්‍රධාන ලේකම්වරුන් ඉදිරිපත් කරන යෝජනාවලට, අදාළ පාර්ශව කැඳවා අවශ්‍ය විසඳුම් ලබාදීමට කටයුතු කරන ලදි. ඒ ඒ පළාතට අදාළ වන්නාවූ පාර්ලිමේන්තුවට යොමු කරන ලද ප්‍රශ්නවලට අදාල තොරතුරු පළාත් බලධාරීන්ගෙන් ලබාගෙන ප්‍රශ්නවල වර්තමාන තත්වය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම යනාදි කටයුතු ද ඉටු කරන ලදි.

පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම සහ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා ලැබූ ඉල්ලීම් අමාත්‍යාංශය විසින් පරීක්ෂා කර බලා නිර්දේශ සමග කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි. මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලය සමාලෝචනය කර පළාත් සභා වෙත දන්වා යවා ඇත.

**2012.12.31 දිනට මෙම අංශයේ ක්‍රියාකාරකම් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| කාර්යය | වෙන්කල මුදල (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය | (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| මානව සම්පත් සංවර්ධනයට දේශීය හා විදේශීය පුහුණු ලබා දීම. | 1.00 | 0.98 | නිලධාරීන් 51 දෙනෙකු පුහුණුව සඳහා යොමු කිරීම | - | 98% |
| ධුරධාරීන්ගේ වරප්‍රසාද හා පහසුකම් සැලසීම වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම. | - | - | ධුරධාරීන් සඳහා ආනයන බලපත්‍ර 363 ක් ලබාදීම. | 100% | - |
| පළාත් සභාවලට අදාළ දත්ත පද්ධතියක් සකස් කිරීම | - | - | දත්ත එකතු කිරීම, සැකසීම හා යාවත්කාලීන කිරීම | 100% | - |

## 9.3 නීති අංශය

පිළිගත් ජාතික ප්‍රතිපත්ති ව්‍යුහයක් තුල මහජන ශුභ සිද්ධිය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාර පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන පරිපාලනමය හා සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, මග පෙන්වීම, නීතිමය, තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාදීම මෙහෙවර කොට ගත් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ නෛතිකමය කාර්යභාරය වඩාත් ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කරලීම උදෙසා අමාත්‍යාංශයීය නීති අංශය ස්ථාපිත කර ඇත.

### 9.3.1 කාර්යභාරය

01. උප ජාතික පාලනයේ දෙවන හා තෙවන ස්ථර අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාමේදී උද්ගත වන නෛතිකමය ගැටලු සම්බන්ධව මැදිහත් වීම, එහිදී පවත්නා නීතීන් හා අනු නීතීන් සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව නව නීතීන් හා අනු නීතීන් සැකසීමට අදාළ කටයුතු කිරීම.
02. පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුළ උද්ගත වන නෛතිකමය ගැටලු සම්බන්ධව උපදෙස් ලබා දීම.
03. අමාත්‍යාංශයට එරෙහිව අධිකරණයේ ගොනු කරනු ලබන පෙත්සම් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම.
04. පහළ අධිකරණ කටයුතුවලට සහභාගි වීම සහ අමාත්‍යාංශය නියෝජනය කිරීම.
05. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කරනු ලබන පෙත්සම්වලට අදාළ කටයුතු කිරීම.

### 9.3.2 නීති අංශයේ 2012 වර්ෂයේ ප්‍රගතිය

මෙරට මැතිවරණ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් පළාත් පාලන මැතිවරණ ක්‍රමය සඳහා කොට්ඨාශ ක්‍රමය පදනම් කරගත් මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙමින් 2012 අංක 21 දරන පළාත් පාලන (විශේෂ විධි විධාන) පනත සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත සම්මත කර ගැනීම මෙම අංශය 2012 වසරේ සිදු කරන ලද විශේෂ කාර්යයක් ලෙස පෙන්වා දිය හැකිය.

## 9.4 සංවර්ධන හා සැලසුම් අංශය

දිවයිනේ විවිධ පළාත්වල ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් වේ. එකී සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම, ඊට අදාළ ප්‍රගති සමාලෝචන හා සාකච්ඡා ජාතික මට්ටමින් පැවැත්වීම, පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ කාර්යභාරයන්ට අදාළ අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තා ඇතුළු ප්‍රගති විමර්ශන වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සංවර්ධන හා සැලසුම් අංශය මගින් කෙරෙන ප්‍රධාන කාර්යයක් වේ.

### 9.4.1 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සහ සංවර්ධන වැඩසටහන - 2012

මෙම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සහ මෙහෙයවීමෙන් සියලුම පළාත් සභා නියෝජනය කරමින් 2012 පෙබරවාරි මස 04 දින සිට 10 දින දක්වා අනුරාධපුර, ඔයාමඩුවේ දී පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට, පළාත් සභා පර්ෂදය ලෙස සාර්ථකව සහභාගී විය. සියලු අමාත්‍යාංශ අතරින් 6 වන ස්ථානය ලබාගැනීමට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට හැකිවිය.

2012 දැයට කිරුළ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 18 ක් තුළ පහත සඳහන් වන භෞතික ප්‍රගතීන් අනුව ව්‍යාපෘති අවසන් කර ඇත. මෙම

වසර සඳහා වෙන්කල මුදල රුපියල් මිලියන 100 ක් වන අතර, ගෙවූ මුදල රු. මිලියන 52.15 කි. මේ අනුව වසර අවසානයට මූල්‍ය ප්‍රගතිය 52% ක් බව සඳහන් කළහැක. ගෙවීමට ඇති ඉතිරි මුදල 2013 වර්ෂයේ ගෙවීමට නියමිතය.

මේ අනුව දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සහ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතිවල 2012.12.31 දිනට භෞතික ප්‍රගතිය පහත පරිදිවේ.

| ව්‍යාපෘතියේ නම | භෞතික ප්‍රගතිය % |
|---|---|
| 01. කහටගස්දිගිලිය ප්‍රා.ස. ශ්‍රවනාගාරය සහ දෙමහල් පුස්තකාලය සඳහා උපකරණ මිලදී ගැනීම | 100 |
| 02. රාජාංගනය ප්‍රා.ස. ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම | 100 |
| 03. හොරව්පතාන ප්‍රා.ස. ගොඩනැගිල්ලේ බිම් මහල වැඩ නිම කිරීම | 100 |
| 04. ම.නු.ප. විලච්චිය සතිපොළ දියුණු කිරීම | 100 |
| 05. වලිසිංහ හරිස්චන්ද්‍ර ක්‍රීඩාපිටිය අලංකරණය කිරීම | 100 |
| 06. නැ.නු.ප. තුරුලිය සෙවන නිවාඩු නිකේතනයේ ආරක්ෂක කුටිය හා වැට ඉදිකිරීම | 100 |
| 07. මැදවච්චිය ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදිකිරීම | 95 |
| 08. මිහින්තලේ ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදිකිරීම | 70 |
| 09. නැ.නු.ප. කුඩානෙළුබෑව සායන මධ්‍යස්ථාන පිවිසුම් මාර්ගය ඉදිකිරීම | 60 |
| 10. තලාව ප්‍රා.ස. ගොඩනැගිල්ලේ බිම් මහල ඉදිකිරීම | 90 |
| 11. නැ.නු.ප. කුඩානෙළුබෑව පාසල ඉදිරිපිට මුස්ලිම් විදුහල දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම | 90 |
| 12. නැ.නු.ප. ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදිකිරීම | 100 |
| 13. පදවිය ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදිකිරීම | 100 |
| 14. තිරප්පනේ ප්‍රා.ස. ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිකිරීම ඉතිරි වැඩ නිම කිරීම | 100 |
| 15. කහටගස්දිගිලිය ප්‍රා.ස. පුස්තකාලයේ අඩුපාඩු සකස් කර ගැනීම හා පොත් මිලදී ගැනීම | 100 |
| 16. කැබිතිගොල්ලෑව ප්‍රා.ස. ගොඩනැගිල්ලේ බිම් මහල ඉදිකිරීම | 100 |
| 17. රාජාංගනය ප්‍රා.ස පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 100 |
| 18. නොච්චියාගම ප්‍රා.ස. නගරශාලාව ඉදිකිරීම | 95 |
| 19. තුරුලිය සෙවණ නිවාඩු නිකේතනය ඉදිකිරීම | 50 |
| 20. විලච්චිය බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 100 |
| 21. කහටගස්දිගිලිය ප්‍රා.ස. ශ්‍රවනාගාරය ඉදිකිරීම | 100 |
| 22. ඉපලෝගම ප්‍රා.ස. ගොඩනැගිල්ලේ බිම් මහල ඉදිකිරීම | 80 |
| 23. ම.නු.ප. පෙරියම්කුලම ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ නිමකිරීම | 100 |

| ව්‍යාපෘතියේ නම | භෞතික ප්‍රගතිය % |
|---|---|
| 24. ම.නු.ප. ඔයාමඩුව ප්‍රා.ස. කාර්යාල ගොඩනැගිල්ලට භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම | 50 |
| 25. අනුරාධපුර සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම | 80 |
| 26. රඹෑව ප්‍රා.ස. ආපනශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම | 75 |
| 27. රඹෑව ප්‍රා.ස. භූමිය වටා කම්බි වැට සහ ඉදිරිපස ගේට්ටුව ඉදිකිරීම | 100 |
| 28. රඹෑව ප්‍රා.ස. කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 90 |
| 29. කහටගස්දිගිලිය වෙළඳ මධ්‍යස්ථානය මායිම් තාප්පය, පැති කාණු ඉදිකිරීම | 20 |
| 30. ම.නු.ප. ගොඩනැගිල්ල ඉදිකිරීම | 90 |
| 31. පොතානේගම ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම | 90 |
| 32. පොතානේගම ආදාහනාගාරයේ භූමියේ වැට, ගේට්ටුව, වැසිකිළි පද්ධතිය ඉදිකිරීම හා එම භූමිය සකස් කිරීම | 90 |
| 33. පන්ඩුලගම ඉදිකරමින් පවතින ප්‍රා.ස.කාර්යාල ගොඩනැගිල්ල පිහිටි භූමියේ වැට ගේට්ටුව ඉදිකිරීම | 25 |
| 34. ඔයාමඩුව ප්‍රා.ස. කාර්යාලයේ වැට ගේට්ටුව ඉදිකිරීම | 90 |
| 35. මහබුලංකුලම කෘෂි අලෙවි මධ්‍යස්ථානයේ ගබඩා සංකීර්ණය ඉදිකිරීම | 20 |
| 36. නාච්චදූව ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදිරිපිට කාණු පද්ධතිය ඉදිකිරීම | 60 |
| 37. නොච්චියාගම පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 70 |
| 38. ගල්නෑව ප්‍රා.ස. ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිකිරීම | 70 |
| 39. ගලෙන්බිඳුනුවැව නාගරික ජල ව්‍යාපෘතිය | - |
| 40. කුඩා නෙළුබෑව සායන මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව ඉදිකිරීම | 100 |
| 41. කැකිරාව පොදු වෙළඳසැල ඉදිකිරීම | 40 |
| 42. අනුරාධපුර මහ නගර සභාවේ කියවීම් ශාලාව ඉදිකිරීම | 20 |

### 9.4.2 විශේෂ නගර සංවර්ධනය

නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතනවල තාක්ෂණික සහ උපදේශාත්මක සහය ඇතිව, පළාත් සභාවල ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු හා පළාත් පාලන කොමසාරිස් කාර්යාල මැදිහත් වීම මත පහත සඳහන් කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන නව අංගයක් වේ.

ඒ අනුව ඒ ඒ නගර ආශ්‍රිතව කෙරෙන සංවර්ධන කටයුතුවල මේ දක්වා අත්පත් කර ගෙන ඇති භෞතික ප්‍රගතීන් මෙන්ම, එක් එක් නගරය සංවර්ධනය කිරීමට හඳුනා ගෙන ඇති ව්‍යාපෘති කාලය, ව්‍යාපෘති පිරිවැය, මේ දක්වා මුළු වියදම සහ 2012 වසරට අදාළ මූල්‍ය ප්‍රගතිය පහත සටහනෙන් දැක්වේ.

| නගරය | ක්‍රියාත්මක ව්‍යාපෘති | භෞතික ප්‍රගතිය % |
|---|---|---|
| **හක්මණ නගර සංවර්ධනය**<br>**2008-2013 (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 406<br>මුළු වියදම 263<br>**2012 (රු.මිලියන)**<br>ප්‍රතිපාදන 37.30<br>සත්‍ය වියදම 26.72<br>මූල්‍යප්‍රගතිය 72% | 01. ප්‍රා.ස. ගොඩනැගිල්ල හා ගබඩාව ඉදිකිරීම<br>02. නගර ශාලාව ඉදිකිරීම<br>03. මහජන වැසිකිළි පද්ධතිය ඉදිකිරීම<br>04. මහජන පුස්තකාලය ඉදිකිරීම<br>05. ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය ඉදිකිරීම<br>06. අභ්‍යන්තර මාර්ග හා කාණු පද්ධතිය ඉදිකිරීම<br>07. ප්‍රවේශ මාර්ග ඉදිකිරීම<br>08. වෙළඳපොළ නවීකරණය කිරීම<br>2008-2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 65% | 100<br>100<br>100<br>100<br>100<br>100<br>15<br>10 |
| **දෙහිඕවිට**<br>**බහු කාර්ය සංකීර්ණය**<br>**2010-2013 (රු. මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 250<br>මුළු වියදම 177<br>**2012 (රු.මිලියන)**<br>ප්‍රතිපාදන 75.00<br>සත්‍ය වියදම 74.99<br>මූල්‍ය ප්‍රගතිය 100% | 01. පැති බැම්ම ඉදිකිරීම හා භූමිය ගොඩකිරීම<br>02. බහු කාර්ය සංකීර්ණය ඉදිකිරීම<br>2010-2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 71% | 100<br>75 |
| **පල්ලේපොළ**<br>**නගර සංවර්ධනය**<br>**2010-2013 (රු. මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 350<br>මුළු වියදම 19<br>**2012 (රු. මිලියන)**<br>ප්‍රතිපාදන 10.00<br>සත්‍ය වියදම 2.63<br>මූල්‍ය ප්‍රගතිය 26% | 01. නගරයේ කාණු පද්ධතිය ඉදිකිරීම<br>02. මහජන රථගාල ඉදිකිරීම<br>03. මහජන වැසිකිළි පද්ධතිය ඉදිකිරීම<br>2010-2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 5% | 100<br>100<br>100 |
| **පඬුවස්නුවර නගර සංවර්ධනය**<br>**2011-2013 (රු. මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 250<br>මුළු වියදම 33<br>**2012 (රු. මිලියන)**<br>ප්‍රතිපාදන 40.00<br>සත්‍ය වියදම 22.14<br>මූල්‍ය ප්‍රගතිය 55% | 01. සියඹලාගස්වැව පාරිසරික කලාපයක් ලෙස වැඩිදියුණු කිරීම<br>02. පඬුවස්නුවර නගරයේ අතුරු මාර්ග සංවර්ධනය<br>03. නව පරිපාලන ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම<br>04. ආදාහනාගාරය ඉදිකිරීම<br>05. බස් නැවතුම් ඉදිකිරීම<br>2011-2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 13% | 100<br>100<br>100<br>30<br>20 |

| නගරය | ක්‍රියාත්මක ව්‍යාපෘති | භෞතික ප්‍රගතිය % |
|---|---|---|
| **බෙලිඅත්ත නගර සංවර්ධනය**<br>**2011-2015 (රු. මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 300<br>මුළු වියදම 41<br>**2012 (රු. මිලියන)**<br>ප්‍රතිපාදන 70.00<br>සත්‍ය වියදම 13.62<br>මූල්‍ය ප්‍රගතිය 20% | 01. අම්පිටිය වැව පාරිසරික කලාපයක් වශයෙන් වැඩිදියුණු කිරීම<br>02. ළමා උද්‍යානය හා ක්‍රීඩාපිටිය ඉදිකිරීම<br>2011-2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 14% | 100<br>100 |
| **හොරණ නගර සංවර්ධනය**<br>**2009-2013 (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 300<br>මුළු වියදම 12<br>**2012 (රු. මිලියන)**<br>ප්‍රතිපාදන 22.70<br>සත්‍ය වියදම 7.26<br>මූල්‍ය ප්‍රගතිය 32% | 01. පුස්තකාලය නවීකරණය කිරීම<br>02. පැරණි උසාවි ගොඩනැගිල්ල නවීකරණය කර නගර සභා කාර්යාලය ස්ථාපිත කිරීම<br>03. ක්‍රීඩාගාරය නවීකරණ කිරීම<br>2009 - 2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 4% | 100<br>50<br>100 |
| **බුත්තල**<br>**නගර සංවර්ධනය**<br>**2010 (රු. මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 69<br>මුළු වියදම 69<br>මූල්‍ය ප්‍රගතිය 100% | 01. බස් නැවතුම්පොළ ඉදිකිරීම<br>02. කාණු පද්ධතිය ඉදිකිරීම<br>03. වෙළඳ සංකීර්ණය ඉදිකිරීම<br>04. කඩ සාප්පු ඉදිකිරීම<br>05. අභ්‍යන්තර මාර්ග සංවර්ධනය | 100<br>100<br>100<br>100<br>100 |
| **අක්කරෙයිපත්තුව**<br>**නගර සංවර්ධනය**<br>**2011 - 2015 (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 300<br>මුළු වියදම 143<br>**2012 (රු. මිලියන)**<br>ප්‍රතිපාදන 90.00<br>සත්‍ය වියදම 81.88<br>මූල්‍ය ප්‍රගතිය 91% | 01. පොදු වෙළඳ පොළ 1,2 අදියර ඉදිකිරීම<br>02. මහ නගර සභා ගොඩනැගිල්ල ඉදිකිරීම<br>03. සාප්පු සංකීර්ණය 1,2 අදියර ඉදිකිරීම<br>2011 - 2012 කාලයට අදාළ මූල්‍ය ප්‍රගතිය 48% | 100<br>80<br>100 |

# විශේෂ නගර සංවර්ධනය යටතේ සාර්ථකව නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්

## හක්මණ නගර සංවර්ධනය





හක්මණ නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අතිගරු ජනාධිපතිතුමා අතින් විවෘත කිරීම



හක්මණ පුස්තකාලය

## බුත්තල නගර සංවර්ධනය



වෙළඳ සංකීර්ණය ඉදිකිරීම



කඩ සාප්පු ඉදිකිරීම



බස් නැවතුම්පළ ඉදිකිරීම

## අක්කරෙයිපත්තු නගර සංවර්ධනය



බස්නැවතුම්පළ ඉදිකිරීම



වෙළඳ සංකීර්ණය ඉදිකිරීම

## 9.5 අපද්‍රව්‍ය කළමනාකරණය

දැක්ම : සැමට වඩාත් සුවදායී පරිසරයක්

අරමුණ : පළාත් පාලන බල ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**කාර්යභාරය**

01. පළාත් පාලන ආයතන සඳහා විධිමත් හා යෝග්‍ය අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් හඳුන්වාදීම පිණිස කාර්යපටිපාටි සංග්‍රහ සම්පාදනය සහ උපදේශනය සැපයීම.
02. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිසි තාක්ෂණ සහාය පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත ලබාදීම.
03. අපද්‍රව්‍ය කළමනාකරණයේ දේශීය හා විදේශීය අත්දැකීම් නිර්මාණයහි ලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම.
04. යහ කළමනාකරණය හා පුරෝගාමී අත්දැකීම් නිර්මාණයේලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම.
05. රාජ්‍ය නොවන සංවිධාන හා මූල්‍ය ආයතනයන් ගෙන් තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාගැනීමට පළාත් පාලන ආයතනවලට සහායවීම.

### 9.5.1 අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ යෙදවුම් වල 2012.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

(අ). බස්නාහිර පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 01 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 500 ලබාදීම | හෝමාගම ප්‍රා.සභාව | 0.02 | 40 | 70 |

(ආ). මධ්‍යම පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 16 කි)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානය | නුවරඑළිය ප්‍රා. සභාව | 2.301 | 20 | 10 |
| 02. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | මිණිපේ ප්‍රා. සභාව | 0.948 | 20 | 10 |
| 03. ජීවවායු නිෂ්පාදනය | ගම්පොළ නගර සභාව | 1.079 | 100 | 100 |
| 04. කසළ බැහැර කිරීම සඳහා පොදු බක්කි - 12 ක් ස්ථාපනය කිරීම | නුවරඑළිය ප්‍රා. සභාව | 0.226 | 40 | 40 |
| 05. පාසල්වල ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය රැස්කිරීමේ කුටි ඉදිකිරීම | තලවකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ (සුමන මහා විද්‍යාලය සහ දෙමළ මහා විද්‍යාලය) | 0.513 | 100 | 100 |
| 06. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 750 ලබාදීම | මහනුවර මහා නගර සභාව | 0.30 | 40 | 30 |
| 07. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 200 ලබාදීම | පාතදුම්බර ප්‍රා. සභාව | 0.800 | 40 | 30 |
| 08. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 100 ලබාදීම | මැදදුම්බර ප්‍රා. සභාව | 0.120 | 50 | 25 |
| 09. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 300 ලබාදීම | උඩුනුවර ප්‍රා. සභාව | 0.100 | 50 | 50 |
| 10. ට්‍රැක්ටර් ට්‍රේලරය ලබාදීම | මැදදුම්බර ප්‍රා. සභාව | 0.119 | 50 | 100 |
| 11. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 50 ලබාදීම | යටිනුවර ප්‍රා. සභාව | 0.250 | 100 | 100 |
| 12. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 208 ලබාදීම | තලවකැලේ ලිඳුල නගර සභාව | 0.112 | 50 | 30 |
| 13. කොම්පෝස්ට් හැලීමේ උපකරණය (Huller machine) | මාතලේ ප්‍රාදේශීය සභාව | 0.175 | 100 | 100 |
| 14. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 50 ලබාදීම | මාතලේ ප්‍රා. සභාව | 0.212 | 45 | 100 |
| 15. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 50 ලබාදීම | යටවත්ත ප්‍රා. සභාව | 0.825 | 100 | 100 |
| 16. කම්කරුවන් 35 දෙනෙකු සඳහා පුහුණුව ලබාදීම | වත්තේගම නගර සභාව<br>නුවරඑළිය ප්‍රා. සභාව<br>හාරිස්පත්තුව ප්‍රා.සභාව<br>මිණිපේ ප්‍රා. සභාව<br>ඇල්ල ප්‍රා. සභාව | 0.256 | 100 | 100 |

(ඇ). දකුණු පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 14 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. කොම්පෝස්ට්කරණය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම | තංගල්ල නගර සභාව | 0.585 | 20 | 80 |
| 02. කොම්පෝස්ට්කරණය සඳහා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම හා හලර් යන්ත්‍රය ස්ථානගත කිරීමට කුඩා කාමරයක් සෑදීම | පස්ගොඩ ප්‍රා. සභාව | 0.581 | 100 | 100 |
| 03. කසළ වෙන්කිරීමේ බඳුන් 150 ලබාදීම | තංගල්ල ප්‍රා. සභාව | 0.088 | 50 | 100 |
| 04. කසළ වෙන්කිරීමේ බඳුන් 100 ලබාදීම | අකුරැස්ස ප්‍රා. සභාව | 0.292 | 90 | 100 |
| 05. නොදිරණ ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම හා යන්ත්‍ර සූත්‍ර ලබාදීම | වැලිගම නගර සභාව | 2.48 | 45 | 60 |
| 06. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 500 ලබාදීම | අම්බලන්ගොඩ නගර සභාව | 0.270 | 100 | 100 |
| 07. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 250 ලබාදීම | මාලිම්බඩ ප්‍රා. සභාව | 0.140 | 60 | 70 |
| 08. කොම්පෝස්ට් අංගනය සඳහා | තවලම ප්‍රා. සභාව | 3.653 | 0 | 40 |
| 09. කොම්පෝස්ට් අංගනය වැඩිදියුණු කිරීම | බද්දේගම ප්‍රා. සභාව | 0.213 | 20 | 100 |
| 10. කම්කරුවන් 200 ක් සඳහා පුහුණුවට | මාතර මහා නගර සභාව | 0.572 | 100 | 100 |
| 11. කම්කරුවන් 30 ක් සඳහා පුහුණුව ලබාදීම | තිහගොඩ ප්‍රා. සභාව<br>මාලිම්බඩ ප්‍රා. සභාව<br>කිරින්ද පුහුල්වැල්ල ප්‍රා.ස.<br>තවලම ප්‍රා. සභාව<br>නාගොඩ ප්‍රා. සභාව<br>බද්දේගම ප්‍රා. සභාව<br>පස්ගොඩ ප්‍ර. සභාව | 0.429 | 100 | 100 |
| 12. රෝද හතරේ ට්‍රැක්ටරය ලබාදීම | හක්මන ප්‍රා. සභාව | 1.475 | 100 | 100 |
| 13. රෝද හතරේ ට්‍රැක්ටරය ලබාදීම | හම්බන්තොට ප්‍රා. සභාව | 1.475 | 100 | 100 |
| 14. ගලිබවුසරය ලබාදීම | හම්බන්තොට නගර සභාව | 2.575 | 100 | 100 |

(ඈ). උතුරු පළාතේ යෙදවුම් වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 06 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානයට | මන්නාරම නගර සභාව | 3.917 | 40 | 30 |
| 02. පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානයට | කරච්චි ප්‍රා. සභාව | 1.569 | 20 | 0 |
| 03. අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු වැඩමුළුව සඳහා | යාපන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සඳහා | 0.176 | 88 | 100 |
| 04. ට්‍රැක්ටර් මවුන්ටඩ් ගලිබවුසර් ලබාදීම | යාපනය මහා නගර සභාව | 2.575 | 100 | 100 |
| 05. ට්‍රැක්ටර් මවුන්ටඩ් ගලිබවුසර් ලබාදීම | මුසලී ප්‍රා. සභාව | 2.575 | 100 | 100 |
| 06. ට්‍රැක්ටර් මවුන්ටඩ් ගලිබවුසර් ලබාදීම | වවුනියා දකුණ ප්‍රා. සභාව | 2.575 | 100 | 100 |

(ඉ). නැගෙනහිර පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 06 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා | 0.345 | 45 | 80 |
| 02. ගලිබවුසර් රථය ලබාදීම | ඒරාවූර් ප්‍රා. සභාව | 2.575 | 100 | 100 |
| 03. කම්පැක්ටර් රථය ලබාදීම | අක්කරේපත්තු ප්‍රා. සභාව | 6.272 | 100 | 100 |
| 04. කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම අවිච්ඡේද | කින්නියා ප්‍රා.සභාව | 2.922 | 40 | 40 |
| 05. කසළ වෙන්කිරීමේ බඳුන් 100 ලබාදීම | දෙහිඅත්තකණ්ඩිය ප්‍රා. සභාව | 0.352 | 100 | 100 |
| 06. කසළ වෙන්කිරීමේ බඳුන් 150 ලබාදීම | කන්තලේ ප්‍රා. සභාව | 0.114 | 100 | 100 |

(ඊ). වයඹ පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 08 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. අවසන් අපහරණ භූමිය වැඩිදියුණු කිරීම | කුලියාපිටිය නගර සභාව | 0.733 | 51 | 80 |
| 02. කසළ වෙන්කිරීමේ බඳුන් 100 ලබාදීම | කුලියාපිටිය නගර සභාව | 0.938 | 100 | 100 |
| 03. කසළ වෙන්කිරීමේ බඳුන් 400 ලබාදීම | ඉබ්බාගමුව ප්‍රා. සභාව | 0.141 | 40 | 50 |
| 04. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 250 ලබාදීම | වෙන්නප්පුව ප්‍රා. සභාව | 0.100 | 70 | 75 |
| 05. ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් 200 ලබාදීම | කොබෙයිගනේ ප්‍රා. සභාව | 0.200 | 68 | 70 |
| 06. කොම්පෝස්ට් අංගනය | කල්පිටිය ප්‍රා. සභාව | 3.251 | 38 | 40 |
| 07. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | හලාවත ප්‍රා. සභාව | 0.398 | 100 | 100 |
| 08. කසළ වෙන්කිරීමේ බඳුන් 245 ලබාදීම | පඬුවස්නුවර ප්‍රා.සභාව | 0.131 | 46 | 25 |

(උ). උතුරුමැද පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 02 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | මධ්‍යම නුවරගම් පළාත ප්‍රා. සභාව | 0.911 | 20 | 10 |
| කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | නොච්චියාගම ප්‍රා.සභාව | 2.983 | 75 | 100 |

(ඌ). ඌව පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 03 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | හල්දුම්මුල්ල ප්‍රා. සභාව | 0.640 | 20 | 30 |
| 02. කම්කරුවන් සඳහා වූ පුහුණුව | තෝරාගත් පළාත් පාලන ආයතන | 0.500 | 50 | 100 |
| 03. ට්‍රැක්ටර් ටේලරයක් ලබාදීම | මහියංගණය ප්‍රා. සභාව | 0.250 | 100 | 100 |
| | හල්දුම්මුල්ල ප්‍රා. සභාව | 0.250 | 100 | 100 |
| | තනමල්විල ප්‍රා.සභාව | 0.250 | 100 | 100 |
| | පස්සර ප්‍රා. සභාව | 0.250 | 100 | 100 |
| | මඩුල්ල ප්‍රා. සභාව | 0.250 | 100 | 100 |

(එ). සබරගමුව පළාතේ යෙදවුම්වල ප්‍රගතිය (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 04 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | පැල්මඩුල්ල ප්‍රා. සභාව | 1.897 | 20 | 35 |
| 02. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | ඇඹිලිපිටිය නගර සභාව | 2.969 | 100 | 100 |
| 03. අවසන් අපහරණ භූමිය වැඩිදියුණු කිරීම | රත්නපුර මහා නගර සභාව | 0.654 | 20 | 65 |
| 04. කසළ වෙන්කිරීමේ බඳුන් 100 ලබාදීම | නිවිතිගල ප්‍රා. සභාව | 0.675 | 100 | 100 |

(ඒ). වෙනත් කටයුතු සඳහා යෙදවුම් (ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ගණන 02 කි.)

| ව්‍යාපෘතීන් | ව්‍යාපෘති බල ප්‍රදේශය | 2012 වසරේදී ලබාදුන් මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| කම්කරුවන් සඳහා වූ ජාතික වෘත්තීය පුහුණු පාඨමාලාව | පළාත් පාලන ආයතන 40 | 0.439 | 50 | 30 |
| 2012 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය | අනුරාධපුරය | 0.991 | 100 | 100 |

## මෙම වැඩසටහනේ ක්‍රියාකාරී අවස්ථාවන්:






ගරු අමාත්‍යතුමන් විසින් අදාළ පළාත් පාලන ආයතන වෙත වාහන ලබාදීම



කසල කළමනාකරණ පුහුණු වැඩමුළුවක අවස්ථාවක්
මොනරාගල ප්‍රාදේශීය සභාව

## අපද්‍රව්‍ය කළමණාකරනයේ විවිධ අවස්ථාවන්:



කාබනික පොහොර නිෂ්පාදනය
කුලියාපිටිය නගර සභාව



මළ අපද්‍රව්‍ය කළමණාකරණ අංගනය
කුලියාපිටිය නගර සභාව

## 9.6 විමංසන අංශය

### 9.6.1 පළාත් සභා ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය

පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් කිරීම විමංසන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යය සඳහා මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානය, පළාත් සභා ඇස්තමේන්තු, සත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු උපයෝගී කර ගනී. මෙම තොරතුරු විමංසනය තුළින් මතුවන විචල්‍යතා හා ගැටලු පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට ලක්කිරීමට කටයුතු කරන අතර එමගින් තම මූල්‍ය කටයුතුවල අපේක්ෂිත ඉලක්කයන් කරා පළාත් සභා යොමු කරවීම මෙමගින් අරමුණු කෙරේ.

ඒ අනුව 2010, 2011 සහ 2012 වර්ෂවලදී පළාත් සභා වෙතින් ලබා ගත් තොරතුරු අනුව පිළියෙල කරන ලද පළාත් සභා ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ). මධ්‍යම රජයේ ප්‍රදාන හා එම ප්‍රදාන මුදා හැරීම් *(රු.මි.)*

| ප්‍රදාන වර්ගය | 2010 | | | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | 2012.12.31 දිනට මුදා හැරීම් | % |
| **(අ). පුනරාවර්තන වියදම** (සාමූහික ප්‍රදාන) | 85,300 | 85,299 | 100 | 94,603 | 94,603 | 100 | 94,877 | 91,551 | 96 |
| **(අ). මුළු පුනරාවර්තන ප්‍රදාන** | **85,300** | **85,299** | **100** | **94,603** | **94,603** | **100** | **94,877** | **91,551** | **96** |
| **(ආ).ප්‍රාග්ධන ප්‍රදාන** | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන පළාත් කාර්යය | 3,075 | 2,612 | 85 | 4,460 | 3,854 | 86 | 4,375 | 2,859 | 65 |
| නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 12,423 | 12,222 | 98 | 12,019 | 9,952 | 83 | 13,520 | 6,409 | 47 |
| **(ආ) මුළු ප්‍රාග්ධන ප්‍රදාන** | **15,498** | **14,834** | **96** | **16,479** | **13,806** | **84** | **17,895** | **9,268** | **52** |
| **මුළු ප්‍රදාන (අ+ආ)** | **100,798** | **100,133** | **99** | **111,082** | **108,409** | **98** | **112,772** | **100,819** | **89** |

(ආ). පළාත් සභා මුළු ආදායම (රු.මි.)

| ආදායම් වර්ගය | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | 2012.12.31 දිනට සත්‍ය ආදායම |
| පිරිවැටුම් බදු | 23,110.0 | 19,986.0 | 19,352.0 | 4,617 | 635 | 188 |
| වාහන බලපත්‍ර ගාස්තු | 3,590.0 | 3,588.0 | 3,934.0 | 4,362 | 4,737 | 5,142 |
| මත්පැන් බලපත්‍ර ගාස්තු | 470.0 | 529.0 | 362.0 | 577 | 658.00 | 794 |
| පොළී | 256.8 | 1,075.0 | 1,063.0 | 1,244 | 1,430 | 1,921 |
| උසාවි දඩ | 1,005.7 | 1,506.6 | 1,021.0 | 1,465 | 1,673 | 1,890 |
| මුද්දර ගාස්තු | 5,616.5 | 6,712.0 | 5,933.0 | 13,987 | 6,266 | 6,458 |
| අනෙකුත් | 6,772.0 | 3,429.4 | 4,196.0 | 14,739 | 36,006 | 32,842 |
| **මුළු ආදායම** | **40,821.0** | **36,826.0** | **35,861.0** | **40,991** | **51,405** | **49,235** |

(ඇ). පළාත් සභාවන්හි පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම (රු.මි.)

| වියදමේ ස්වභාවය | 2010 | | | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | 2012.12.31 දිනට සත්‍ය වියදම් | % |
| **(අ). පුනරාවතන වියදම** | **125,653** | **119,162** | **95** | **128,860** | **129,601** | **101** | **145,229** | **139,120** | **96** |
| **(ආ). ප්‍රාග්ධන වියදම** | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන යටතේ වියදම | 4,018 | 3,654 | 91 | 5,958 | 6,612 | 111 | 10,445 | 8,223 | 79 |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන * | 13,942 | 10,945 | 79 | 11,810 | 10,364 | 88 | 13,520 | 8,866 | 66 |
| **(ආ). ප්‍රාග්ධන වියදම් එකතුව** | **17,960** | **14,599** | **81** | **17,768** | **16,976** | **96** | **23,965** | **17,089** | **71** |
| **මුළු එකතුව (අ+ආ)** | **143,613** | **133,761** | **93** | **146,628** | **146,577** | **100** | **169,194** | **156,209** | **92** |

* - පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අධ්‍යාපනය හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ ප්‍රදාන ද ඇතුළත් වේ.

2011* - 2011 වර්ෂයේ ඇස්තමේන්තුවට අතිරේක ප්‍රතිපාදන ඇතුළත් වී නොමැත.

### 9.6.2 පළාත් අනුව පළාත් පාලන ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් පළාත් පාලන ආයතන 335ක් පළාත් සභා 09 යටතේ ක්‍රියාත්මක වේ. මෙම පළාත් පාලන ආයතනවල ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන්නේ වරිපනම් බදු, කුලී, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ, මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල්ය. මෙයට අමතරව මධ්‍යම රජය, පළාත් සභා හා අනෙකුත් සංවිධාන විසින් ආදායම් ආධාර සහ ප්‍රාග්ධන ආධාර ද මෙම ආයතනවලට ලබා දෙනු ලැබේ.

එසේම මෙම පළාත් පාලන ආයතනවල ප්‍රධාන වියදම් වර්ගීකරණයන් වන්නේ වැටුප් ගෙවීම්, ගමන් ගාස්තු, මිලදී ගැනීම් හා කාර්යාල අවශ්‍යතා, ප්‍රාග්ධන වත්කම් නඩත්තු වියදම්, ප්‍රවාහන ගාස්තු, පොළී ගෙවීම්, ආධාර ගෙවීම්, විශ්‍රාම වැටුප් ගෙවීම් සහ ප්‍රාග්ධන වැය යනාදියයි.

පළාත් පාලන ආයතනවල ආදායම්, වියදම්, කාර්ය මණ්ඩල තොරතුරු සහ පොදු පහසුකම් යනාදිය ඇතුළත් වාර්තාවක් සෑම වර්ෂයකම විමංසන අංශය විසින් පිළියෙල කරනු ලබන අතර 2012 වර්ෂය සඳහා ද එම වාර්තාව පිළියෙල කර ඇත. මෙම වාර්තාව මඟින් පෙන්නුම් කරනු ලබන තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන වෙත යොමු කරනු ලැබේ.

ඒ අනුව, 2012 වර්ෂයට අදාළ සත්‍ය ආදායම් සහ වියදම් විස්තර පහත සඳහන් පරිදි වේ.

(අ). පළාත් අනුව පළාත් පාලන ආයතනවල 2012 වර්ෂයේ ආදායම (රු.මිලියන)

| පළාත | ප.පා.ආ. සංඛ්‍යව | ආදායම් ඇස්ත-මේන්තුව | සත්‍ය ආදායම | | | මුළු ආධායම | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| | | | ආදායම් ආධාර | ප්‍රාග්ධන ආධාර | සභා ආදායම | | |
| බස්නාහිර | 48 | 17,373 | 4,800 | 2,029 | 9,001 | 15,830 | 91 |
| මධ්‍යම | 43 | 5,578 | 1,160 | 3,861 | 2,277 | 7,298 | 131 |
| දකුණ | 49 | 5,057 | 834 | 1,559 | 1,205 | 3,598 | 71 |
| උතුර | 34 | 5,220 | 761 | 433 | 775 | 1,969 | 38 |
| වයඹ | 33 | 3,916 | 682 | 805 | 1,461 | 2,948 | 75 |
| උතුරු මැද | 26 | 2,276 | 257 | 748 | 492 | 1,497 | 66 |
| ඌව | 28 | 1,470 | 416 | 420 | 585 | 1,421 | 97 |
| සබරගමුව | 29 | 1,820 | 461 | 275 | 827 | 1,563 | 86 |
| නැගෙනහිර | 45 | 3,834 | 503 | 940 | 538 | 1,981 | 52 |
| **එකතුව** | **335** | **46,544** | **9,874** | **11,070** | **17,161** | **38,105** | **82** |

(ආ). පළාත් අනුව පළාත් පාලන ආයතනවල 2012 වර්ෂයේ වියදම (රු.මිලියන)

| පළාත | ප.පා.ආ. සංඛ්‍යව | වියදම් ඇස්ත-මේන්තුව | සත්‍ය වියදම | | මුළු වියදම | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රාග්ධන | පුනරාවර්තන | | |
| බස්නාහිර | 48 | 17,545 | 3,374 | 11,675 | 15,049 | 86 |
| මධ්‍යම | 43 | 5,672 | 2,016 | 2,702 | 4,718 | 83 |
| දකුණ | 49 | 4,593 | 1,897 | 1,895 | 3,792 | 83 |
| උතුර | 34 | 5,114 | 649 | 1,252 | 1,901 | 37 |
| වයඹ | 33 | 3,824 | 1,010 | 1,769 | 2,779 | 73 |
| උතුරු මැද | 26 | 2,136 | 623 | 726 | 1,349 | 63 |
| ඌව | 28 | 2,162 | 486 | 797 | 1,283 | 59 |
| සබරගමුව | 29 | 1,559 | 232 | 1,033 | 1,265 | 81 |
| නැගෙනහිර | 45 | 3,767 | 1,081 | 1,040 | 2,121 | 56 |
| **එකතුව** | **335** | **44,813** | **11,368** | **22,889** | **34,257** | **76** |

# 10

# ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති
## (විදේශ අරමුදල් මත ක්‍රියාත්මක)

### 10.1 පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍ර සඳහා විදේශ මූල්‍ය සහාය

ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජනපද ආධාර වැඩසටහන, යුරෝපා සංගමය, ජපන් රජය, නෙදර්ලන්ත රජය සහ ආසියා පදනම වැනි විදේශ මූල්‍ය ආයතන මගින් ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සහාය දෙනු ලබන අතර පහත සඳහන් විදේශ මූල්‍ය ආයතන සමඟ සහයෝගය හා සම්බන්ධතාවය ගොඩනඟා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර, ලබා ගත හැකි ණය ආධාර ප්‍රමාණය විශාල වශයෙන් ඉහළ ගොස් තිබේ. 2012 වසර සඳහා ද මෙම ව්‍යාපෘති එලෙසම ක්‍රියාත්මක වේ.

#### 10.1.1 ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති

01. පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - (LGIIP) (ආසියානු සංවර්ධන බැංකුව - (ADB)
02. පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - මධ්‍යම හා සබරගමුව පළාත් PRDP (Cen. & Sab. Provinces) (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පදනම - (JICA)
03. පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ඌව, නැගෙනහිර, උතුරු පළාත් PRP (Uva, Eastern, Northern Provinces) (ලෝක බැංකුව - WB)
04. නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (Eastern & North Central PRP) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
05. උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (Northern Road Connectivity Project) (ආසියානු සංවර්ධන බැංකුව - (ADB)
06. ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම මඟින් දිළිඳු ගැමි ජනතාවගේ ජීවන තත්වය නංවාලීමේ ව්‍යාපෘතිය (Improving Connectivity to Support Livelihood and Gender Equality Project) (ආසියානු සංවර්ධන බැංකුව - (ADB)
07. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (Greater Colombo Waste Water Management Project) (ආසියානු සංවර්ධන බැංකුව - (ADB)
08. ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2 අදියර (Upgrading Disaster Response Network in Urban LAs in Sri Lanka Phase II) (නෙදර්ලන්ත රජය - Govt. of Neatherland)
09. 'පුර නැගුම' - පළාත් පාලනය නඟාසිටුවීමේ ව්‍යාපෘතිය Local Government Enhancement Sector Project (ආසියානු සංවර්ධන බැංකුව - ADB)

10. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (Iranamadu Irrigation Development Project) (IFAD)
11. යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය Jaffna Killinochchi Water Supply Sanjtation Project) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
12. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය (Human Capital Foundation for a Knoweledge Economy) Education Project (ලෝක බැංකුව - WB)
13. හදිසි ස්වාභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය (Emergency Natural Disaster Reconstruction Project) (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පදනම - JICA)

### 10.1.2 පළාත් සහ ග්‍රාමීය මාර්ග ක්ෂේත්‍රය සඳහා වූ දැවැන්ත සංවර්ධන සහාය

පළාත් මාර්ග සංවර්ධනය යටතේ ආසියානු සංවර්ධන බැංකුව (ADB) ආධාර සපයන පළාත් මාර්ග ව්‍යාපෘතිය මඟින් මේ වන විට නැගෙනහිර පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 151 න් 85% හා උතුරු මැද පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 220න් 88% ක වැඩ නිම කර ඇත.

එසේම ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය මුදල් යටතේ ක්‍රියාත්මක කෙරෙන උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය යටතේ තෝරාගත් මාර්ග කි.මී. 142න් 58%ක වැඩ නිම කර ඇත.

මෙම ආසියානු සංවර්ධන බැංකුවේම (ADB) ආධාර යටතේ ක්‍රියාත්මක කරන ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම තුළින් දිළිඳු ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ග්‍රාමීය මාර්ග කි.මී. 250 ක් සංවර්ධනය කර ඇත.

ලෝක බැංකු (WB) ණය මුදල් සපයන පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඌව පළාතේ තොරාගත් මාර්ග කි.මී. 124න් 57% ක ද, නැගෙනහිර පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 60න් 50% ක ද, උතුරු පළාතේ තෝරාගෙන ඇති මාර්ග කි.මී. 56න් 23% ක ද වැඩ නිම කර ඇත.

ලෝක බැංකු (WB) ණය මුදල් සපයන ග්‍රාමීය මාර්ග නියමු ව්‍යාපෘතිය යටතේ ද මාර්ග කි.මී. 161ක් සංවර්ධනය කර ඇත. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) ණය මුදල් සපයන පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 163න් 20% ක වැඩ නිම කර ඇති අතර, සබරගමුව පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 180න් 8.5% ක වැඩ නිම කර ඇත.

(අ) ශ්‍රී ලංකාවේ මාර්ග පිළිබඳ විස්තර

| පළාත | A ශ්‍රේණියේ මාර්ග km | B ශ්‍රේණියේ මාර්ග km | පළාත් මාර්ග | ග්‍රාමීය මාර්ග E ශ්‍රේණියේ මාර්ග km | | |
|---|---|---|---|---|---|---|
| | | | C හා D ශ්‍රේණියේ මාර්ග km | තාර | කොන්ක්‍රීට් | බොරළු |
| බස්නාහිර | 1813.88 | 1208.75 | 1951.87 | 6696.65 | 2356.96 | 7979.77 |
| වයඹ | 354.56 | 968.28 | 1722.63 | 1004.00 | 722.55 | 17901.23 |
| මධ්‍යම | 408.57 | 1330.79 | 2025.77 | 1344.58 | 2432.27 | 5769.79 |
| ඌව | 471.04 | 693.03 | 1737.38 | 3603.76 | 1754.61 | 6552.26 |
| සබරගමුව | 415.57 | 804.18 | 2112.54 | 1724.30 | 1132.13 | 3365.21 |
| උතුරු මැද | 489.00 | 700.02 | 11575.20 | 747.79 | 344.21 | 14315.09 |
| නැගෙනහිර | 618.83 | 551.13 | 1097.76 | 1270.05 | 461.72 | 8775.22 |
| දකුණ | 346.88 | 1018.51 | 4958.29 | 2820.72 | 2522.27 | 6801.69 |
| උතුරු | 852.88 | 560.54 | 1827.42 | 1607.05 | 5790.41 | 1348.68 |
| **එකතුව** | **5771.21** | **7835.23** | **29008.86** | **20818.9** | **17517.13** | **72808.94** |

(අ). නව මාර්ග සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ණය ආධාර ලබා දෙන ආයතනය | දිග (කිලෝ මීටර්) |
|---|---|---|
| (අ). නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධනය කිරීම | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 371 |
| (ආ). පළාත් මාර්ග වැඩිදියුණු කිරීම (නැගෙනහිර, උතුර, ඌව පළාත්) | ලෝක බැංකුව (WB) | 240 |
| (ඇ). පළාත් මාර්ග සංවර්ධනය කිරීම (සබරගමුව, මධ්‍යම පළාත්) | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව (JICA) | 350 (පුනරුත්ථාපනය) |
| (ඈ). ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම මඟින් දිළිඳු ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම (නැගෙනහිර, මධ්‍යම පළාත්) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 250.55 (පුනරුත්ථාපනය) |
| (ඉ). උතුරු පළාත් මාර්ග සම්බන්ධිත | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 142 (පුනරුත්ථාපනය) |

# 11

# ව්‍යාපෘති මාලාව

## 11.1. පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

| | |
|---|---|
| ආධාර ලබාදෙනු ලබන ආයතනය | : ආසියානු සංවර්ධන බැංකුව (ADB) |
| මූලික අරමුණු | : දිවයිනේ තෝරාගත් පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු සිදුකිරීම තුළින්, එම පළාත් පාලන බල ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ආර්ථික සහ ජීවන තත්වය නංවාලීම සහ පළාත් පාලන ආයතන කාර්යක්ෂම සහ ආකර්ෂණීය පරිපාලන ඒකකයක් වනු පිණිස දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් සහ ශිල්පීමය දැනුමෙන් පිරිපුන් ආයතන බවට පත් කිරීම. |
| ව්‍යාපෘති සංරචක | : පළාත් සහ ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම, කාර්යාල ගොඩනැගිලි, පුස්තකාල, ප්‍රජා මධ්‍යස්ථාන වැනි ගොඩනැගිලි ඉදිකිරීම, ආදාහනාගාර ඉදිකිරීම, මාර්ග නඩත්තු උපකරණ සැපයීම සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සැපයීම. |
| ව්‍යාපෘති පිරිවැය | : රු.මිලියන 6,570 |
| ව්‍යාපෘති කාලය | : 2006 - 2013 ජනවාරි |
| 2012.12.31 දිනට මුළු වියදම | : රු. මිලියන 5,606 |
| 2012.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | : 85% |

2012 වර්ෂයට අදාළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1,660 ක් වන අතර, 2012.12.31 දිනට වැය කර ඇති මුදල රුපියල් මිලියන 1,274 කි. ඒ අනුව 2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය 77% ක් වන අතර 2006 - 2012 කාලයට අදාළ සමස්ථ මූල්‍ය ප්‍රගතිය 85% කි. මෙම ව්‍යාපෘතිය යටතේ ඉතිරි මුදල් 2013 වර්ෂයේදී යෙදවීමට නියමිතය.

අදාළ ව්‍යාපෘති කාලසීමාව නිම වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කල උප ව්‍යාපෘති 202 සාර්ථකව නිම කර ඇති බැවින්, භෞතික ප්‍රගතිය 100% ක් ලෙස සඳහන් කල හැක. පහත දැක්වෙන්නේ සාර්ථකව නිමකල ව්‍යාපෘති කිහිපයකි.



*ගොඩකවෙල පුස්ථකාල හා සෞඛ්‍ය මධ්‍යස්ථානය - සබරගමුව පළාත*



*කටුගම්පොල ආයුර්වේද ගොඩනැගිල්ල - වයඹ පළාත*




*නියාගම ප්‍රා.ස. ආදාහනාගාරය - දකුණු පළාත*

## 11.2. පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - මධ්‍යම හා සබරගමුව පළාත්වල (PRDP - Central & Sabaragamuwa Provinces)

ආධාර ලබාදෙනු ලබන ආයතනය : ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA)

ව්‍යාපෘති අරමුණු : පළාත් මාර්ග (සී සහ ඩී පංතියේ මාර්ග) පුනරුත්ථාපනය කිරීම සහ සේවා තත්ත්වය උසස් කිරීම මඟින් විශ්වසනීය මාර්ග ජාලයක් ඇති කිරීම හා එමඟින් දේශීය ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය සැපයීම හා ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සහ පළාත් සභාවල මාර්ග සම්බන්ධ ආයතනවල සහ මාර්ග කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම යනාදිය වේ.



ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 14,212

ව්‍යාපෘති කාලය : 2010-2014

2012.12.31 දිනට මුළු වියදම : රු. මිලියන 2,665

2012.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය - 19%

| ව්‍යාපෘති ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| සබරගමු පළාත | 180 |
| මධ්‍යම පළාත | 163 |
| එකතුව | 343 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘති ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සබරගමු පළාත | 1,125 | 839 | 75 |
| මධ්‍යම පළාත | 1,125 | 974 | 87 |
| සම්බන්ධීකරණ ඒකකය | 287 | 257 | 90 |
| එකතුව | 2,537 | 2,070 | 82 |

භෞතික ප්‍රගතිය අනුව මධ්‍යම පළාතේ මාර්ගවලින් 20% ක් ද, සබරගමුව පළාතේ මාර්ගවලින් 8.5% ක වැඩ ද මේ වන විට නිම කර ඇති බව සඳහන් කල හැක.

### ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්



*කරලියද්ද පුටුහපුව වේරලියද්ද මාර්ගය සැකසීම මධ්‍යම පළාත*



*තෙල්දෙණිය කෝබට් ගැප් මාර්ගය පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම - මධ්‍යම පළාත*

## 11.3. පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ඌව, උතුරු සහ නැගෙනහිර (PRP - Uva, Northern, Eastern Provinces)

ආධාර ලබාදෙනු ලබන ආයතනය : ලෝක බැංකුව (WB)


මූලික අරමුණු : ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල සමාජීය සහ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමෙන්, එම පළාත්වල ස්වයංපෝෂිත ආර්ථික රටාව වැඩිදියුණු කිරීම වේ.

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 11,760

ව්‍යාපෘති කාලය : 2010-2015

2012.12.31 දිනට මුළු වියදම : රු.මිලියන 4,769

2012.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය : 41%



| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| ඌව පළාත | 124 |
| නැගෙනහිර පළාත (අම්පාර) | 60 |
| උතුරු පළාත (යාපනය) | 56 |
| එකතුව | 240 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | 568 | 516 | 91 |
| ඌව පළාත | 1,420 | 1,292 | 91 |
| උතුරු පළාත | 503 | 447 | 89 |
| සම්බන්ධීකරණ ඒකකය | 85 | 78 | 92 |
| එකතුව | 2,576 | 2,333 | 91 |

භෞතික ප්‍රගතිය අනුව ඌව පළාතේ මාර්ගවලින් 52% ක් ද, නැගෙනහිර පළාතේ මාර්ගවල 50% ක්ද, උතුරු පළාතේ මාර්ගවලින් 23% ක වැඩ ද මෙම ව්‍යාපෘතිය යටතේ මේ වන විට නිම කර ඇති අතර, ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

### ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්



*කොට්ටගොඩ මාස්පන්න යලගමුව මාර්ගය ඉදිකිරීම - ඌව පළාත*



*විලිනියාදි මාර්ගය ඉදිකිරීම - නැගෙනහිර පළාත*

## 11.4. නැගෙනහිර සහ උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතිය (Eastern & North Central Provincial Road Project)


ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මූලික අරමුණු : දරිද්‍රතාවයෙන් යුත් සහ යුද්ධයෙන් පීඩිත පළාත් දෙකෙහි මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මගින් එහි සම්බන්ධතාවන් වැඩි කිරීම සහ උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල පළාත් මාර්ග සංවර්ධන ආයතන ශක්තිමත් කිරීම.

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 6,825

ව්‍යාපෘති කාලය : 2009 - 2013

2012.12.31 දිනට මුළු වියදම : රු. මිලියන 6,398



2012.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය - 94%

| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| නැගෙනහිර පළාත | 151 |
| උතුරු මැද පළාත | 220 |
| එකතුව | 371 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | 888 | 810 | 91 |
| උතුරු මැද පළාත | 1,175 | 978 | 83 |
| සම්බන්ධීකරණ ඒකකය | 16 | 11 | 68 |
| එකතුව | 2,079 | 1,799 | 87 |

නැගෙනහිර පළාතේ මාර්ගවල 85% ක වැඩ ද, උතුරු මැද පළාතේ 88% ක වැඩ ද මෙම ව්‍යාපෘතිය යටතේ මේ වන විට නිම කර ඇති අතර, ව්‍යාපෘතිය සාර්ථකව අවසන් අදියරේ ක්‍රියාත්මක වෙමින් පවතී.

### 2012 වර්ෂයේදී නිම කරන ලද ව්‍යාපෘති කිහිපයක්





*පරසන්ගස්වැව - කටුකැලියාව - අනුරාධපුරය පාර සහ පාලම (32Km)*

## 11.5. උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (Northern Road Connectivity Project)


ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මූලික අරමුණු : උතුරු පළාත තුළ වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙකෙහි ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම මඟින් පළාත තුළ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 2,775

ව්‍යාපෘති කාලය : 2010-2015

2012.12.31 දිනට මුළු වියදම : රු. මිලියන 1,508



2012.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය : 54%

| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| උතුරු පළාත | 142 |
| එකතුව | 142 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 870 | 749 | 86 |
| සම්බන්ධීකරණ ඒකකය | 13 | 5 | 38 |
| එකතුව | 883 | 754 | 85 |

මාර්ග කි.මී. 142 න් 58% ක වැඩ මේ වන විට නිම කර ඇති අතර වැයකර ඇති මුළු මුදල රු. මිලියන 1,508 කි. මේ අනුව සමස්ථ මූල්‍ය ප්‍රගතිය 54% ක් පමණ වේ. එසේම 2012 වසරට අදාළ මූල්‍ය ප්‍රගතිය ද ඉහතින් දැක්වේ. මේ වන විට ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වන අතර, 2015 දී නිමවීමට නියමිතය.

## 11.6. ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම මගින් දිළිඳු ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ ව්‍යාපෘතිය (Improving Connectivity to Support Livelihood and Gender Equality Project)


ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මූලික අරමුණු : ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම තුළින් නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල තෝරාගත් දිස්ත්‍රික්කවල යුද්ධයෙන් විපතට පත් වූ සහ මෙතෙක් අවධානයට යොමු නොවූ ග්‍රාමීය දිළිඳු ජනකොටස්වල ජීවන තත්ත්වය නංවාලීම.

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 353

ව්‍යාපෘති කාලය : 2011-2012

2012.12.31 දිනට මුළු වියදම : රු. මිලියන 323



| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| උතුරු මැද පළාත | 142.70 |
| නැගෙනහිර පළාත (ත්‍රිකුණාමලය, මඩකලපුව) | 107.85 |
| එකතුව | 250.55 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම මගින් දිළිඳු ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ ව්‍යාපෘතිය | 203 | 186 | 92 |
| එකතුව | 203 | 186 | 92 |

මෙම ව්‍යාපෘතිය 2012 අවසානයට 97% භෞතික ප්‍රගතියක් ද, 92% මූල්‍ය ප්‍රගතියක් ද අත්පත් කර ගෙන ඇත.




*පළාත් පාලන ආයතන වෙත මාර්ග නඩත්තු උපකරණ බෙදා දීම*

## 11.7. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (Greater Colombo Waste Water Management Project)

| | | |
|---|---|---|
| ආධාර ලබාදෙනු ලබන ආයතනය | : | ආසියානු සංවර්ධන බැංකුව (ADB) |
| මූලික අරමුණු | : | කොළඹ සහ දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශ තුළ සහ කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ පවතින අපජල කළමනාකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | : | මේ යටතේ ප්‍රධාන වශයෙන් අපජල පොම්පාගාර 04 ක් ඉදිකිරීම 07 ක් නවීකරණය කිරීම, පීඩන නළ මාර්ග 02 ක් ඉදිකිරීම, අපජල පද්ධතිය කි.මී. 9 ක් නවීකරණය කිරීම සහ අපජලය මුහුදට බැහැර කරන ප්‍රධාන නල මාර්ග 02 ක් නවීකරණය කිරීම සිදු කෙරේ. |
| ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 12,771 |
| ව්‍යාපෘති කාලය | : | 2010 - 2014 |
| 2012.12.31 දිනට මුළු වියදම | : | රු. මිලියන 607 |
| 2012.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | : | 5% |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 879 | 387 | 44 |
| එකතුව | 879 | 387 | 44 |

2012 වසර අවසානයට 25% භෞතික ප්‍රගතියක් ඇතිව ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. එසේම සමස්ථ හා 2012 වසර අවසානයට මූල්‍ය ප්‍රගතීන් ඉහතින් දැක්වේ.





*කොළඹ නගරය තුළ අපජල පද්ධති නවීකරණය කරන අවස්ථා*

## 11.8. ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2 අදියර (Upgrading Disaster Response Network in Urban LAs in Sri Lanka Phase II)

ආධාර ලබාදෙනු ලබන ආයතනය : නෙදර්ලන්ත රජය (Govt. of Netherlands)

මූලික අරමුණු : පළාත් පාලන ආයතන සඳහා ගිනි නිවීමේ සහ ජීවිත ගලවා ගැනීමේ තාක්ෂණික පහසුකම් සැපයීම

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 4,791

ව්‍යාපෘති කාලය : 2010-2012

| අදියර | ක්‍රියාත්මක ප්‍රදේශ |
|---|---|
| I | මහ නගර සභා 14, නගර සභා 4, ප්‍රාදේශීය සභා 1 |
| II | ත්‍රිකුණාමලය සහ හලාවත නගර සභා |
| III | උතුරු පළාත - යාපනය මහ නගර සභාව, වවුනියාව නගර සභාව නැගෙනහිර පළාත - අක්කරෙයිපත්තු මහ නගර සභාව, මඩකලපුව මහ නගර සභාව, අම්පාර නගර සභාව |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (2 අදියර) | 1,555 | 673 | 43 |
| එකතුව | 1,555 | 673 | 43 |

2012 වසර අවසානයට 95% භෞතික ප්‍රගතියක් සහ 93% ක මූල්‍ය ප්‍රගතියක් සහිතව ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිමා විය.

පළාත් පාලන ආයතනවලට බෙදාදෙන ලද වාහන





## 11.9. පුර නැගුම - පළාත් පාලන ආයතන නගාසිටුවීමේ ව්‍යාපෘතිය (Local Government Enhancement Sector Project)

| | | |
|---|---|---|
| ආධාර ලබාදෙනු ලබන ආයතනය | : | ආසියානු සංවර්ධන බැංකුව (ADB) |
| මූලික අරමුණු | : | පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් ප්‍රතිනිර්මාණය කිරීම සහ පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ 108 ක් තුළ කුඩා නගර 108 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. |
| ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 7,568 |
| ව්‍යාපෘති කාලය | : | 2012 - 2015 |
| ව්‍යාපෘති සංරචක | : | මෙය කුඩා නගර දියුණුකිරීමේ වැඩසටහනකි. මෙම ව්‍යාපෘතිය යටතේ සතිපොළවල්, වෙළඳ සංකීර්ණ, ළමා උද්‍යාන, පුස්තකාල, රථගාල්, ගිමන්හල්, සෞඛ්‍ය හා මාතෘ සායන, ප්‍රජා හා තොරතුරු මධ්‍යස්ථාන, ජල ව්‍යාපෘති, සුසාන භූමි, ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිලි ආදිය ඉදිකිරීම කරනු ලැබේ. |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පුර නැගුම | 434 | 25 | 6 |
| එකතුව | 434 | 25 | 6 |

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තෝරා ගත් නගර

| පළාත | දිස්ත්‍රික්කය | තෝරා ගත් නගරය |
|---|---|---|
| වයඹ | කුරුණෑගල | පොල්පිතිගම, ගිරිබාව, කිතලව, උඩුබද්දාව, බෝවත්ත, අලව්ව, මාවතගම, රිදීගම |
| | පුත්තලම | වනාතවිල්ලුව, නොරොච්චෝලෙයි, මාදම්පේ, ආරච්චිකට්ටුව, නවගත්තේගම |
| සබරගමුව | කෑගල්ල | ගලිගමුව, දිප්පිටිය, මොරන්තොට, රුවන්වැල්ල, දැරණියගල, දෙහිඕවිට, යටියන්තොට, බුලත්කොහුපිටිය |
| | රත්නපුරය | රත්නපුර නව නගරය, වැලිඔය, පැල්මඩුල්ල, කහවත්ත, අයගම, කොලොන්න, උඩවලව, බෙළිහුල්ඔය. |
| මධ්‍යම | මාතලේ | රත්තොට, කිඹිස්ස, නාඋල, හෙට්ටිපොළ, මැටිහක්ක, පුස්සැල්ල, විලක්කරය, කළුගඟ නුවරකඩේ |
| | මහනුවර | උඩුදුම්බර, හසලක, ගලහ, තෙල්දෙණිය, ගලගෙදර, ගුරුදෙණිය, පන්විල, බරිගම, උඩ පළාත |
| | නුවරඑළිය | මස්කෙලිය, රාගල |

| පළාත | දිස්ත්‍රික්කය | තෝරා ගත් නගරය |
|---|---|---|
| ඌව | මොණරාගල | සියඹලාන්ඩුව, හිඟුරුකඩුව, මැදගම, මඩුල්ල, වැල්ලවාය, තණමල්විල, කතරගම |
| | බදුල්ල | උඩවෙල, දියතලාව, හල්අතුතැන්න, ලුණුගල, හීල්ඔය, කන්දකැටිය, මීගහකිවුල, ලූණුවත්ත, ආඥාඋල්පත |
| බස්නාහිර | කොළඹ | හංවැල්ල |
| | ගම්පහ | පල්ලේවෙල, දිවුලපිටිය, මාවරමණ්ඩිය |
| | කළුතර | මතුගම, දොඩම්ගොඩ, අඟුරුවාතොට, අගලවත්ත, බදුරලිය, ඉත්තෑපාන |
| දකුණ | හම්බන්තොට | කටුවන, දෙබරවැව, බෙල්ලගස්වැව, ලුණුගම්වෙහෙර, සූරියවැව |
| | ගාල්ල | ඌරගස්මංහංදිය, ඇත්කඳුර, උඩුගම, තවලම (නැගෙනහිර), නෙලුව, ඉමදූව |
| | මාතර | හක්මන, කඹුරුපිටිය, ඌරුබොක්ක, කත්තුඩුව, තිහගොඩ, කිරින්ඳ, පුහුල්වැල්ල, අකුරැස්ස, මාලිම්බඩ, තිබ්බොටුවාව, දෙණියාය, පිටබැද්දර |
| උතුරු මැද | පොලොන්නරුව | අරලගන්විල, වැලිකන්ද, තල්පොත |
| | අනුරාධපුරය | හොරොව්පතාන, ගලෙන්බිඳුනුවැව, පරාක්‍රමපුර, කැබිතිගොල්ලෑව, ආඬිගල, බුල්නෑව, රබෑව, තිරප්පනේ, පහේකණුව, මහඉලුප්පල්ලම |

2012 වසර අවසානයට 6% මූල්‍ය ප්‍රගතියක් ඇතිව ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

## 11.10. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (Iranamadu Irrigation Development Project)

ආධාර ලබාදෙනු ලබන ආයතනය : කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD)

මූලික අරමුණු : වාරිමාර්ග යටිතල පහසුකම් ඵලදායි හා තිරසාර කළමනාකරණයක් සඳහා දියුණු කිරීම ජල හා භූමි ඵලදායිතාවය තිරසාර ලෙස දියුණු කිරීම

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 3,800

ව්‍යාපෘති කාලය : 2012-2017

| ක්‍රියාත්මක ප්‍රදේශ | වාරි මාර්ගය (කි.මී.) |
|---|---|
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 288 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය


| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 200 | 3 | 1.5 |
| සම්බන්ධීකරණ ඒකකය | 6 | - | - |
| එකතුව | 206 | 3 | 1.5 |

මූලික සැලසුම් කටයුතු ආරම්භ කර ඇත.

## 11.11. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය (Human Capital Foundation for a Knoweledge Economy - Education Project)

| | | |
|---|---|---|
| ආධාර ලබාදෙනු ලබන ආයතනය | : | ලෝක බැංකුව (WB) |
| මූලික අරමුණු | : | දැනුම පාදක කරගත් ආර්ථික හා සමාජීය සංවර්ධනයේ පදනම ලෙස ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය හා එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධන කිරීම. |
| ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 13,000 |
| ව්‍යාපෘති කාලය | : | 2012-2017 |

| ක්‍රියාත්මක ප්‍රදේශ |
|---|
| සමස්ත දිවයින පුරා |




ද්විතීය පාසල් 1000 ක සහ ප්‍රාථමික පාසල් 1500 ක සංවර්ධන කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කිරීමට අපේක්ෂිතය. අමාත්‍යාංශය හා පළාත් සභා අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2012 වසරට අදාළ මූල්‍ය ප්‍රගතිය පහතින් දැක්වේ.

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සම්බන්ධීකරණ ඒකකය | 12 | 11.9 | 99 |
| බස්නාහිර පළාත | 145 | 126.0 | 99 |
| මධ්‍යම පළාත | 116 | 101.0 | 87 |
| දකුණු පළාත | 124 | 102.0 | 82 |
| උතුරු පළාත | 144 | 125.0 | 87 |
| වයඹ පළාත | 144 | 125.0 | 87 |
| උතුරු මැද පළාත | 127 | 111.0 | 87 |
| ඌව පළාත | 137 | 115.0 | 84 |
| සබරගමුව පළාත | 132 | 115.0 | 87 |
| නැගෙනහිර පළාත | 144 | 125.0 | 87 |
| එකතුව | 1,225 | 1,056.9 | 86 |

## 11.12. හදිසි ස්වාභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය (Emergency Natural Disaster Reconstruction Project)

ආධාර ලබාදෙනු ලබන ආයතනය : ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA)

මූලික අරමුණු : ගංවතුරෙන් හානියට පත් මධ්‍යම, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල මාර්ග හා වාරි යෝජනා ක්‍රම පුනරුත්ථාපනය මඟින් එම ප්‍රදේශවල සමාජ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම හා එම ප්‍රදේශවල ආරක්ෂිත හා තිරසාර ජීවන පරිසරයක් නිර්මාණය කිරීමට දායකවීම.

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 10,887

ව්‍යාපෘති කාලය : 2012-2013

| ක්‍රියාත්මක ප්‍රදේශ | මාර්ග (කි.මී.) | වාරි මාර්ග (කි.මී.) |
|---|---|---|
| මධ්‍යම පළාත | 30 | - |
| උතුරුමැද පළාත | 28 | 50 |
| නැගෙනහිර පළාත | 67 | 20 |
| එකතුව | 125 | 70 |

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| හදිසි ස්වාභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 1,995 | 1,990 | 100 |
| එකතුව | 1,995 | 1,990 | 100 |

මාර්ග ක්ෂේත්‍රයේ භෞතික ප්‍රගතිය 66% වාරි මාර්ග ක්ෂේත්‍රයේ භෞතික ප්‍රගතිය 49% කි.

## 11.13. යාපනය හා කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය Jaffna Killinochchi Water Supply Sanitation Project

ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මූලික අරමුණු : යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම, යාපනය මහ නගර සභා සීමාව තුළ ජනතාව සඳහා සනීපාරක්ෂක යටිතල පහසුකම් හා යාපනය අර්ධද්වීපයේ ජල සැපයුම් කළමනාකරණ වැඩසටහන් ශක්තිමත් කිරීම.

ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 21,325.20

ව්‍යාපෘති කාලය : 2011-2016

2012 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 85 | 10 | 12 |
| සම්බන්ධීකරණ ඒකකය | 6 | - | - |
| එකතුව | 91 | 10 | 12 |

ව්‍යාපෘතියට අදාළ මූලික කටයුතු කෙරෙමින් පවතී.

# 12

# පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

## 12.1 හැඳින්වීම

- 1999 අංක 31 දරණ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත යටතේ පිහිටුවන ලදී.
- මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලබලයෙන් සාමාජිකයන් 8ක් සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විතය.
- මෙම ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදුකරනු ලැබේ.

### දැක්ම

කළමනාකරණ, උපදේශන, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙහි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ සහ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමේ එකම ආයතනය බවට පත්වෙමින් එමගින් මහජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට උරදීමයි.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පහත සඳහන් අංශවලින් සමන්විතය,

- ඉංජිනේරු අංශය
- මූල්‍ය කළමනාකරණ අංශය
- පොදු කළමනාකරණ අංශය
- පර්යේෂණ අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- භෞතික සැලසුම් අංශය
- නීති අංශය

### අරමුණු

- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන්හි සහභාගීත්වය ඇතිව පළාත් පාලනය හා සම්බන්ධ ආයතනයන්හි ආයතනික ශක්තිය වැඩිදියුණු කරලීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කරලීම පිණිස පළාත් කළමනාකරණ සහ පුහුණු ඒකක ශක්තිමත් කිරීම.
- පළාත් පාලනයේ සියලු පාර්ශවකරුවන්ට තාක්ෂණ හා තොරතුරු සේවා සපයමින් ජාතික සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

- අදාළ ජාතික හා අන්තර්ජාතික ආයතන සමඟ සබඳතා පවත්වා ගනිමින් පළාත් පාලනයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ ආයතනික කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධව විශේෂඥ සේවා සැපයීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි නෛතික කරුණු සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනවලට අදාළ දත්ත හා තොරතුරු එක්රැස් කිරීම සහ එම තොරතුරු පවත්වාගෙන යාම.

**මෙහෙවර**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙවර වනුයේ කළමනාකරණය, උපදේශනය, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ හා තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමයි. ඒ සඳහා පහත සඳහන් කර්යයන් මෙම ආයතනය විසින් ඉටුකරනු ලබයි.

- පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයන් උපයෝගි කර ගනිමින් පළාත් සභාවන්හි සහ පළාත් පාලන ආයතනයන්හි හැකියා වර්ධනය කිරීම සඳහා සැලසුම් සකස්කොට ක්‍රියාත්මක කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනය ශක්තිමත් කිරීම සඳහා උපදේශනය, පුහුණු සහ පර්යේෂණ සේවා ලබාදීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළාත් පාලනයට සම්බන්ධිත ආයතන සමඟ අන්තර් සබඳතා ගොඩනඟා ගනිමින් පළාත් පාලනය පෝෂණය කිරීම.
- පළාත් පාලන ව්‍යුහය සඳහා තාක්ෂණික තොරතුරු සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන කාර්යක්ෂම කරවීමට අදාළ වන ආධාරක සහ පුහුණු හා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

**12.2** මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පුහුණු වැඩ මුළු, සම්මන්ත්‍රණ හා ප්‍රායෝගික සැසි යනාදී වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම පළාත් පාලන පුවත් ඇතුළත් පළාත් පාලන පුවත්පත සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

(අ) 2012 වර්ෂය සඳහා සැලසුම් කල වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| අංශය | කාර්යය | වර්ෂය තුළ පැවැත්වූ වැඩමුළු/ වැඩසටහන් සංඛ්‍යා | අපේක්ෂිත වියදම (රු.මි.) හා සංඛ්‍යාව | සත්‍ය වියදම (රු.මි.) හා සහභාගි වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| පොදු කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන | පුහුණු වැඩමුළු පැවැත්වීම | 16 | 1.95 | 2.11 | 108 | 91% |
| | සහභාගී වූ සංඛ්‍යාව | | 1,220 | 1,110 | | |
| පර්යේෂණ | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පර්යේෂණ කාර්යයන් | 06 | 3.19 | 2.76 | 87 | අපේක්ෂිත වැඩ සටහන් නිම කිරීම 100% |
| මූල්‍ය කළමණාකරනය | පුහුණු වැඩමුළු සහ පාඨමාලා | 03 | 1.98 | 1.86 | 94 | අපේක්ෂිත වැඩ සටහන් නිම කිරීම 100% |
| නීති අංශය | දැනුවත් කිරීමේ වැඩමුළු | 14 | 1.80 | 1.93 | 107 | 100% |
| | සහභාගී වූ සංඛ්‍යාව | | 945 | 1005 | | |
| ඉංජිනේරු | පුහුණු වැඩමුළු පැවැත්වීම | 04 | 0.35 | 0.18 | 52 | 92% |
| | සහභාගී වූ සංඛ්‍යාව | | 225 | 206 | | |
| භෞතික සැලසුම් | දැනුවත් කිරීමේ වැඩමුළු | 14 | 1.98 | 1.58 | 80% | 117% |
| | සහභාගී වූ සංඛ්‍යාව | | 630 | 738 | | |
| **එකතුව** | | **57** | **11.29** | **10.42** | **92%** | **100%** |

# 13

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

**දැක්ම**

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම.

**මෙහෙවර**

පළාත් පාලන ආයතන බලප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් තිරසාර සහ ස්වාධීන මූල්‍ය ආයතනයක් තුළින් ලබා දී රටේ සමාජ සහ ආර්ථික වර්ධනයට දායකවීම.

**කාර්යභාරය**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනතින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට අයත්වන අතර පනත ක්‍රියාත්මක කිරීමේ බලතල පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය සතුය. දිවයිනේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සහන ණය ක්‍රමයක් යටතේ සපයනු ලබන එකම රාජ්‍ය ආයතනයයි.

**13.1 පළාත් පාලන ආයතන වෙත ණය මුදල් නිකුත් කරනු ලබන සංවර්ධන ව්‍යාපාති පහත දැක්වේ.**

1. ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම සහ සතිපොළ නවීකරණය කිරීම
2. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
3. ආදාහනාගාර ඉදිකිරීම
4. මාර්ග ඉදිකිරීමේ යන්ත්‍ර සූත්‍ර සහ කසළ අපහරණය සඳහා ට්‍රැක්ටර් මිලදී ගැනීම
5. පොදු වෙළඳපළ ඉදිකිරීම
6. කාර්යාල ගොඩනැගිලි සහ පුස්තකාල ඉදිකිරීම
7. මාර්ග සංවර්ධන ව්‍යාපෘති
8. පානීය ජල සැපයුම් ව්‍යාපෘති
9. වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති

## අරමුදල්

ණය මුදල් සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී පදනමක් මත වසර 25 කින් ආපසු ගෙවිය යුතු ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබාදේ.

මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත පළාත් පාලන ආයතන සඳහා නිකුත් කළ ණය මුදල් ආපසු අයකර මහා භාණ්ඩාගාරය වෙත ගෙවීමේ වගකීම ද දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇති අතර, එම අරමුදල් පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සඳහා චක්‍රීය කිරීමේ පහසුකම් ද සලසා ඇත.

## 13.2 2012 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන්

2012 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු. මිලියන 181 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණි. වර්ෂය තුළදී පළාත් පාලන ආයතන 15 වෙත නිකුත් කල මුළු වටිනාකම රු.මි. 76.2 කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 05-10 කින් ආපසු ගෙවිය යුතු වේ. මීට අමතරව අනුමත කර ඇති නමුත්, ඉදිකිරීම්වල ප්‍රගතිය මත නිකුත් කර ඇති ණය මුදල් වල අගය රු. මි. 270 කි.

(අ). 2012 වර්ෂයේදී ණය වාරික සහ පොළී ලැබීමේ ප්‍රගතිය

| ආයතනය / ව්‍යාපෘතිය | 2012 වර්ෂයේ ඇස්තමේන්තුගත මුදල (රු.මි) | | 2012 වර්ෂයේ සත්‍ය ලැබීම් (රු.මි) | | ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|---|
| | වාරික | පොළී | වාරික | පොළී | වාරික | පොළී |
| මහ නගර සභා | 25 | 10 | 21.28 | 8.98 | 85 | 90 |
| නගර සභා | 18 | 9.5 | 21.88 | 13.41 | 12 | 141 |
| ප්‍රාදේශීය සභා | 70 | 29.0 | 71.88 | 27.37 | 103 | 98 |
| නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 60 | 90.0 | 76.69 | 93.59 | 128 | 104 |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | 1.5 | 7.2 | 1.26 | 7.56 | 84 | 105 |
| ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය | 0.4 | 0.8 | 0.22 | 0.46 | 55 | 58 |
| **එකතුව** | **174.9** | **146.5** | **193.21** | **152.37** | | |

(ආ). වර්ෂය තුළ දී ණය නිකුත් කිරීමේ ප්‍රගතිය දැක්වෙන සාරාංශය පහත දැක්වේ.

| ව්‍යාපෘති වර්ගය | පොළී ප්‍රතිශතය | මුදල (රු.මි.) | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|
| මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම | 9% | 62.72 | 10 |
| ආදාහනාගාර ඉදිකිරීම | 7.5% | 2.20 | 01 |
| පොදු වෙළෙඳපොළ ඉදිකිරීම | 12% | 10.53 | 03 |
| කසළ අපහරණ ව්‍යාපෘති | 6.5% | 0.80 | 01 |
| **එකතුව** | | 76.25 | |



“Let us ensure good governance everywhere”